නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුව විසින් සකසන ලද කෙටුම්පත කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. තව ද 2017 ජූලි මස නව කොමිෂන් සභාව පත්වීමෙන් අනතුරුව එම කෙටුම්පත යලිත් සංශෝධන සහිතව අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර එම කෙටුම්පත අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

පනත් කෙටුම්පත තවදුරටත් සලකා බැලීම සඳහාත් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය 1990 අංක 20 දරණ පනත තුළම අන්තර්ගත වී තිබීම හේතුවෙන් පනත් සංශෝධනයේ දී විය හැකි ආයතනික අරමුණු හා බලතල අතර පරස්පරතා මගහරවා ගැනීම සඳහා ආයතන දෙකෙහිම නියෝජනය ඇතුලත් කමිටුවක් කොමිෂන් සභාව මගින් පත් කරන ලදි. තවද,යෝජිත කෙටුම්පත සහ ඉහත තොරතුරු අමාත්‍යාංශය වෙත ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත.

තවද, සම්පූර්ණ පනත එකවර සලකා බලා සංශෝධනය කිරීමේදි සිදුවන ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය කරුණු සම්බන්ධයෙන් රෙගුලාසි සකස් කිරීමට අමාත්‍යවරයා විසින් 2018.11.21 දින රැස්වීමේදී ලබාදුන් උපදෙස් පරිදි සකස් කළ රෙගුලාසි කෙටුම්පතක් ද ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

ලියාපදිංචි නොවූ තෘතීයික හා වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචි කිරීමට ගන්නා ලද පියවර

කොමිෂන් සභාවේ ලියාපදිංචි වීමෙන් තොරව පවත්වා ගෙන යනු ලබන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ආයතන ලියාපදිංචි කර කොමිෂන් සභාවේ නීත්‍යානුකූල අවසරය යටතේ පවත්වාගෙන යාමට අවශ්‍ය පියවරයන් ගනු ලැබිණ. ඒ අනුව පුවත්පත් දැන්වීම් පලකරමින් ලියාපදිංචි නොකර පවත්වා ගෙන යනු ලබන ආයතන වෙත දැනුවත් කිරීමේ ලිපි යැවීම මගින් අදාල ආයතන ලියාපදිංචිය සඳහා යොමු කරන ලද අතර මේ වන විට 2018 වසර සඳහා එවැනි ලිපි 25 ක් පමණ යවා ඇති අතර ආයතන 15 ක් පමණ මේ සඳහා යහපත් ප්‍රතිචාර දක්වා ඇත.

මූල්‍යාධාර නිසිලෙස භාවිතා නොකල ආයතනයන් සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය පියවර

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 04(ඊ) හා 04(උ) වගන්තිය යටතේ පෞද්ගලික අංශයේ / රාජ්‍ය නොවන අංශයේ ආයතනයන්ට දී ඇති මූල්‍ය ප්‍රදානයන් නිසිලෙස ක්‍රියාත්මක නොකර හා පාඨමාලා ප්‍රතීතනය නොවී පවත්වා ගෙන යනු ලබන ආයතනයක් මගින් එම ණය මුදල අයකර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීමද සිදු කරන ලදී.

එහිදී පහත සඳහන් ආයතන සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තුමේන්තුව වෙත යොමුකොට අවශ්‍ය ලේඛන කටයුතු යොදා ඇත.

සමාධි ප්‍රජා සංවර්ධන පදනම හා ශ්‍රී සෝහිත වෘත්තීය පුහුණු ආයතනය සමඵ මණ්ඩල කැඳවූ අතර ඔවුන් සහභාගී නොවීය. එසේ හෙයින් මේ වන විට සමඵ නොකිරීමේ සහතිකයක් නිකුත් කර ඇති අතර නඩු පැවරීමේ කටයුතු සඳහා නීතිපති දෙපාර්තුමේන්තුවට යොමු කරනු ලැබේ. ශ්‍රී සෝහිත වෘත්තීය පුහුණු ආයතනය වෙත එන්තරවාසි නිකුත් කිරීමෙන් අනතුරුව ඔවුන් කළ ඉල්ලීම සලකා බලා මෙම නඩුව සමඵයකට පත්කරමින් ලබා දී තිබූ භාණ්ඩ යළි කොමිෂන් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර ඇත.

විමර්ශන පැවැත්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මෙම කේෂත්‍රයේ නියාමන ආයතනය වශයෙන්, විවිධ කේෂත්‍රයන්ට අදාල පුහුණු මධ්‍යස්ථාන වල සිදුවන ගැටලු සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට අදාල ආයතන, පුහුණුවන්නන් සහ ඇගයීම් නිලධාරීන්ද පෙලඹී තිබේ. එහි දී අපක්ෂපාති මැදිහත්කරුවෙකු වශයෙන් එම ගැටලු සමථයකට පත්කිරීමත් ඊට අවශ්‍ය ඇතැම් පරීක්ෂණ පැවැත්වීමක් සිදුකරයි. ඒ අනුව 2018 වර්ෂයේදී අදාල ආයතන හයක් සම්බන්ධයෙන් විමර්ෂන පැවැත්වීමට කටයුතු කරන ලදී.

කොමිෂන් සභා රැස්වීම පැවැත්වීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) සහ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද කටයුතු කරන අතර 2018 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 06 ක් පවත්වන ලදී.

5.0 සැලසුම් හා පර්යේෂණ අංශය

කොමිෂන් සභාවේ සැලසුම් හා පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පාර්ලිමේන්තු පනතෙහි පළමු අරමුණ වූ, ශ්‍රී ලංකාවේ ආර්ථික හා මානව සම්පත් සංවර්ධන අවශ්‍යතාවන් අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම සඳහා සක්‍රීය දායකත්වය ලබාදීමයි. සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම සඳහා වගකීම දරයි.

- සුදුසුකම්ලත් වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම හා එම ආධාර යොදාගැනීම විමර්ශනය කිරීම
- වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධීකරණ කටයුතු කිරීම
- ශ්‍රී ලංකාවේ පළාත්බද වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්ති සකස්කිරීම හා යාවත්කාලීන කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ආශ්‍රිත සම්බන්ධීකරණය කටයුතු සිදුකිරීම.
- තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම හා ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම
- කොමිෂන් සභාවේ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කිරීම

ඉහත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට, සැලසුම් හා පර්යේෂණ අංශය කාර්යමණ්ඩල සාමාජිකයින් 06 දෙනෙකුගෙන් සමන්විත වේ. කාර්ය මණ්ඩලය අතර අධ්‍යක්ෂවරයෙකු, සහකාර අධ්‍යක්ෂවරු දෙදෙනෙකු, සංවර්ධන නිළධාරිනියක, පරිගණක යෙදවුම් සහායක සහ කාර්යාල කාර්යසහායකවරයෙකු ගෙන් සමන්විතය.

ඒ අනුව, සැලසුම් හා පර්යේෂණ අංශය පහත සඳහන් වැඩසටහන් 2018 වසරේදී ක්‍රියාත්මක කර ඇත.

5.1 රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම හා විමර්ශනය කිරීම.

පුද්ගලික අංශවල හා රාජ්‍ය නොවන පුහුණු ආයතනයන්හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය හා කාර්මික පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා ශ්‍රම වෙළෙඳපොල අදාලත්වය දියුණු කිරීම සඳහා අවශ්‍යවන පුහුණු උපකරණ ලබාදීම පිණිස කොමිෂන් සභාව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ මඟින් පුද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල පුහුණු පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතීතනය කර ඒ තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට හැකියාව ලැබේ.

2018 මූල්‍යාධාර වැඩසටහන සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන තුළින් අයඳුම්පත්‍ර කැඳවන ලදී. ඒ අනුව, එවන ලද අයඳුම්පත්‍ර අතුරින් තෝරාගන්නා ලද පුහුණු ආයතනයන් ඇගයීමට ලක්කර මූල්‍යාධාර ලබාදීමට කටයුතු කරන ලදී. 2018 වර්ෂය තුලදී පෞද්ගලික අංශයට මූල්‍යාධාර ලබාදීම පිළිබඳ විස්තර, අංශ අනුව පහත වගු අංක 5.1 මගින් දැක්වේ.

වගුව 5.1 ලබාදුන් මූල්‍යාධාර ආංශික ව්‍යාප්තිය - 2018

අංශය	2018 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන (රු. මිලියන)	මූල්‍යාධාර ප්‍රදානය සඳහා අනුමත පාඨමාලා සංඛ්‍යාව	ආයතන සංඛ්‍යාව	අනුමත මුදල (රු. මිලියන)
පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය	2.4	09	08	1,444

මූල්‍යාධාර ප්‍රදානය පිළිබඳ විස්තර වෙන් වෙන් වශයෙන් පහත දක්වා ඇත.

5.1.1 පුද්ගලික අංශය හා රාජ්‍ය නොවන වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම

2018 වර්ෂයේදී පුද්ගලික අංශය හා රාජ්‍ය නොවන පුහුණු මධ්‍යස්ථාන විසින් ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා අදාලත්වය ඉහළ නැංවීම පිණිස මූල්‍යාධාර ලබාදීම සඳහා රුපියල් මිලියන 2.4 ක ප්‍රතිපාදන වෙන්වී තිබුණි (සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව). ඒ අනුව, ලැබුණු අයදුම්පත්‍ර 37 අතුරින් තෝරාගන්නා ලද ආයතන 35 ක භෞතික ඇගයීමට ලක්කිරීමෙන්, ආයතන 08 ක් මූල්‍යාධාර ලබාදීම සඳහා තෝරාගන්නා ලදී. එම ආයතන සමඟ ගිවිසුම් අත්සන් කරන ලද අතර වෙන්කරන ලද මූල්‍යාධාර මුදල් එම ආයතන විසින් භාණ්ඩ මිලදී ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ කොමිෂන් සභා නිළධාරීන් පරීක්ෂා කිරීමෙන් පසුව ගෙවනු ලැබේ.

ඒ අනුව, 2018 වර්ෂයේදී සංශෝධිත ප්‍රතිපාදන වලින් 61% ක ප්‍රතිශතයක් මූල්‍යාධාර ප්‍රදානය සඳහා වෙන්කිරීමට හැකියාව ලැබුණි. පෞද්ගලික/රාජ්‍ය නොවන අංශයේ එක් එක් වෘත්තීය පුහුණු ආයතන වෙත ලබාදුන් මූල්‍යාධාර ප්‍රමාණයන් පහත වගු අංක 5.2 මඟින් දක්වා ඇත.

වගුව 5.2: පෞද්ගලික අංශය සහ රාජ්‍ය නොවන වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර ලබාදීම - 2018

2018 වර්ෂයේදී මූල්‍යාධාර ප්‍රදානය සඳහා වෙන්කරන ලද ආයතන පිළිබඳ විස්තර

අංකය	ආයතනයේ නම	පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම	ප්‍රදානය කරනලද උපකරණ හා ප්‍රමාණය	අනුමත කරන ලද මුදල (රු.)
1	සදර්න් ලක්මා හොටෙල් ස්කූල් ඇන්ඩ් බියුටි හෙයාර් ඇකඩමිය 628, ගාලු පාර, කළුතර දකුණ	ආධුනිකයන් සඳහා වූ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී NVQ 3 වන මට්ටම	Computers – 08 UPS – 10 Printer - 01	534,450.00
2	ඇතුගල්පුර උසස් අධ්‍යාපන පාසල 12/2/2, දෙවැනි මහළ, එටිසලාට් ගොඩනැගිල්ල. දඹුල්ල පාර, කුරුණෑගල	හෙද සහයක NVQ 3 වන මට්ටම	Half Body Dummy - 01 Serializer SS (10" x 5') -01 Cheatle Forcep - SS (8") – 01 Cheatle Forcep – JR - 01	103,250.00

අංකය	ආයතනයේ නම	පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම	ප්‍රදානය කරනලද උපකරණ හා ප්‍රමාණය	අනුමත කරන ලද මුදල (රු.)
3	ලසාලියන් කොමියුනිටි එඩියුකේෂන් සර්විසස් අංක 25 සහ 51, පන්සල් පාර, කොළඹ 15	මැහුම් ශිල්පී NVQ 2 වන මට්ටම	Flatlock Machine - 01 Zig Zag Machine - 01	96,529.30
4	එස්. ඒ. පී. පරිගණක ආයතනය අංක 59, ගාමිණිපුර, දික්ඔය පාර, හැටන්	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ශිල්පී NVQ 4 වන මට්ටම	Computers – 02	93,100.00
		පරිගණක චිත්‍රක ශිල්පී NVQ 4 වන මට්ටම	Color Printer - 01	17,500.00
5	හාර්පෝස් හෝටල් පාසල අංක 384, මාතර පාර, මාගාල්ල, ගාල්ල	සූපවේදී NVQ 3 වන මට්ටම	Single Deck Oven - 01 Deep Freezer (Small Size) - 01	97,930.00
6	මොස්වෝල්ඩ් අධ්‍යාපන ආයතනය කස්ටම් පාර, බලපිටිය	සූපවේදී NVQ 3 වන මට්ටම	Cooler - 01 Microwave oven - 01 Electric Oven - 01 Hand Mixture - 03	70,145.59
7	මාතර දිස්ත්‍රික් වාණිජ මණ්ඩල සහ සමාගම අංක 149. හක්මන පාර, මාතර	පරිගණක චිත්‍රක ශිල්පී NVQ 4 වන මට්ටම	Computers – 06	287,700.00
8	සීමාසහිත සමූපකාර රෝහල් සංගමය සමූපකාර හෙද පුහුණු පාසල, අංක 303. කොළඹ පාර, කුරුණෑගල	හෙද සහයක NVQ 3 වන මට්ටම	Human Body Dummy - 01	143,500.00
	අනුමත කරන ලද මුළු මුදල			**1,444,104.89**

වගුව 5.3: කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ලබාදීම - පෞද්ගලික අංශය හා රාජ්‍ය නොවන සංවිධාන

කර්මාන්ත ක්ෂේත්‍රය	පාඨමාලා ගණන	අනුමත කළ මුදල (රු.)	ප්‍රතිශතය(%)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	02	627,550.00	43
සෞඛ්‍ය	02	246,750.00	17
රෙදිපිළි සහ ඇඟලුම්	01	96,529.30	7
මුද්‍රණ	02	305,200.00	21
හෝටල් සහ සංචාරක	02	168,075.59	12
එකතුව	**06**	**2,686,526.50**	**100%**

ප්‍රස්ථාරය 5.1: කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ප්‍රදානය - පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන

2018 වර්ෂය තුලදී ලබාදුන් මූල්‍යාධාර එක් එක් ක්ෂේත්‍රය අනුව එම මුදල් බෙදීගොස් ඇති ආකාරය වගු අංක 5.3 මගින් දැක්වෙන අතර ප්‍රස්ථාර අංක 5.1 මගින් එහි විශ්ලේෂණය දැක්වේ.



5.1.3 මූල්‍යාධාර විමර්ශනය කිරීමේ වැඩසටහන

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතනවලට ලබාදෙන මූල්‍යාධාර නිසිපරිදි භාවිතා කොට ඇත්දැයි විමර්ශනය කිරීම සඳහා වාර්ෂික විමර්ශන වැඩසටහනක් ක්‍රියාත්මක කරයි.

මෙම වැඩසටහන යටතේ 2015, 2016, 2017 වර්ෂයේදී කොමිෂන් සභාව මගින් මූල්‍යාධාර ලබාදුන් පුහුණු ආයතන විමර්ශනයට ලක්කරන ලද අතර, ඒ යටතේ මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා 10 ක් පිලිබඳව විමර්ශනය සිදුකරන ලදී.

මෙම වැඩසටහන තුලින් හඳුනාගත් මූල්‍යාධාර ලබාදුන් පෞද්ගලික අංශයේ පාඨමාලා වලින් 75% ක් පාඨමාලා ප්‍රතිනය වී ඇත.

5.2 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම.

සැලසුම් හා පර්යේෂණ අංශය වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීමෙහි නිරතව සිටී. මෙම වැඩසටහන යටතේ නව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීම මෙන්ම දැනට සකස්කර ඇති සැලසුම් යාවත්කාලීන කිරීම සිදුවේ. 2018 වර්ෂය අවසන් වනවිට වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් 21 ක් සකස්කර ඇති අතර සැලසුම් 16 ක් යාවත්කාලීනකර ඇත.

5.2.1 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් යාවත්කාලීන කිරීම.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය

2018 වර්ෂය තුලදී අවසන් කරනලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම තුල තිරසාර සංවර්ධන අරමුණු (Sustainable Development Goals), විද්‍යුත් රාජ්‍ය ප්‍රතිපත්ති (e-Government Policy) හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත් කෙරෙහිද අවධානය යොමුකර ඇත.

- මෝටර්රථ කාර්මික ක්ෂේත්‍රය

වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැසුම් යාවත්කාලීන කිරීමේ වැඩසටහන යටතේ මෝටර්රථ කාර්මික ක්ෂේත්‍රය සඳහා සැලැස්ම යාවත්කාලීන කිරීම 2018 වර්ෂයේ දෙවන කාර්තුවේදී ආරම්භ කරන ලද අතර, මල්ටි-ටෙක් සොලුයුෂන් පුද්ගලික ආයතනය මේ සඳහා උපදේශන දායකත්වය ලබාදේ. මෙම වාර්ථාව සකස් කිරීම සඳහා මෙම වර්ෂය තුලදී රු. මිලියන 1.088 ක් වැයකර ඇති අතර, 2019 වර්ෂයේ දී මෙම වාර්ථාව සකස්කර අවසන් කිරීමට නියමිතය.

5.3 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම.

සැලසුම් හා පර්යේෂණ අංශය මගින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ කවය පවත්වාගෙන යනු ලබයි (Research Cell). 2005 වර්ෂයේ සිට ආරම්භ කරන ලද පර්යේෂණ කවය මේවන විට කාර්මික හා වෘත්තීය ක්ෂේත්‍රයට වැදගත් පර්යේෂණ රාශියක් එළිදැක්වීම සඳහා මූල්‍යමය හා ශ්‍රම දායකත්වය ලබාදී ඇත. එමෙන්ම නිමකරන ලද පර්යේෂණ කොමිෂන් සභා වෙබ් අඩවිය තුල ඇතුලත්කර ඇත. 2018 වර්ෂයේදී පර්යේෂණ කවය පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

5.3.1 නව පර්යේෂණ අධ්‍යයන

2018 වර්ෂය තුලදී, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට අයත් පුහුණු ආයතන තුලින් පර්යේෂණ යෝජනා කැඳවන ලදී. ඒ අනුව, විවිධ ආයතන නියෝජනය කරමින් පර්යේෂණ යෝජනා 47 ක් පර්යේෂණ කවය වෙත ලැබුණි. එම යෝජනා පර්යේෂණ මෙහෙයුම් කමිටුව (Research Steering Committee) විසින් ඇගයීමට ලක් කිරීමෙන් පසුව ක්ෂේත්‍රයට අයත් උචිත, කාලීන පර්යේෂණ අධ්‍යයන 13 ක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගන්නා ලදී. එම පර්යේෂණ අධ්‍යයනවල ගුණාත්මකභාවය රැකගැනීම සඳහා පර්යේෂණ කටයුතු මෙහෙයවීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ කවය සහ පර්යේෂණ කමිටුව විසින් සිදුකරන ලදී. ඒ සඳහා රු. මිලියන 1.0 ක මූල්‍ය අනුග්‍රහය නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් දරනු ලැබේ. එක් එක් පර්යේෂණ අධ්‍යයනය සඳහා වෙන්කරන ලද වියදම් පහත වගු අංක 5.4 මගින් දැක්වේ.

වගුව 5.4: නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් මූල්‍ය අනුග්‍රහය දක්වන පර්යේෂණ අධ්‍යයනයන් 2018

අනු අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2018 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල (රු.)
1.	කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුවෙහි ගුරුවරුන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා ඇති බාධක පිළිබඳ අධ්‍යයනය	DTET හි තාක්ෂණික විෂය ක්ෂේත්‍රයන්හි නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන විසඳුම් තීරණය කිරීමයි. අරමුණු වන්නේ, ■ පුහුණුකරුවන් වැඩි දියුණු කිරීම සඳහා බාධක හඳුනා ගැනීම. ■ ඉහත තත්ත්වයන් මග හරවා ගැනීම සඳහා විසඳුම්.	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	210,000.00	105,000.00
2.	ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයට වෘත්තීය සංවර්ධන සේවාවේ ක්‍රියාකාරිත්වයේ බලපෑම බස්නාහිර පළාත ඇසුරින් අධ්‍යයනය කිරීම පිළිබඳ අධ්‍යයනය	■ ලංකාවේ රාජ්‍ය අංශයේ වෘත්තීය අධ්‍යාපනයේ නියැලෙන සිසුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වෘත්තීය තොරතුරු සේවාවේ බලපෑම හඳුනාගැනීම. ■ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ වෘත්තීය අධ්‍යාපනයේ නියැලෙන සිසුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සේවාවේ බලපෑම හඳුනාගැනීම.	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	200,000.00	100,000.00

අනු අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2018 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල (රු.)
		■ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ වෘත්තීය අධ්‍යාපනයේ නියැලෙන සිසුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වෘත්තීය උපදේශන සේවාවේ බලපෑම හඳුනාගැනීම			
3	කාර්මික අධ්‍යාපනය තුලින් ව්‍යවසායකයින් හා සමාජීය ව්‍යවසායකයින් බිහි කිරීමට ඇති හැකියාව හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනය	■ කාර්මික අධ්‍යාපනය ලබන සිසුන්ගේ ව්‍යවසායකත්ව හැකියා වර්ධන කළ හැකි අවස්ථා හඳුනා ගැනිම. ■ කාර්මික අධ්‍යාපනය ලද සිසුන් ව්‍යවසායකයින් නොවීමට හේතු හඳුනා ගැනිම. ■ කාර්මික අධ්‍යාපනය තුලින් ව්‍යවසායකත්වය ඇතිවීම සඳහා ඇති බාධක හඳුනාගැනිම. ■ ව්‍යවසායකත්ව හැකියා ඇති පුද්ගලයින් සඳහා කාර්මික අධ්‍යාපන ලබා දිමට ඇති අවස්ථා හඳුනා ගැනිම. ■ කාර්මික අධ්‍යාපනය තුලින් නව ව්‍යාපාර බිහි කිරීම තුලින් ඇතිවන ආර්ථික ප්‍රතිලාභ හඳුනා ගැනිම. ■ ව්‍යවසායකත්ව තුලින් කාර්මික අධ්‍යාපනයේ මූලික අරමුණු ඉටු කර ගැනිමේ හැකියාව ඇගයීම. ■ ව්‍යවසායකත්ව සංවර්ධන අධ්‍යාපනය ලබාදිමේ ගැටලු හඳුනාගත හැකි විම. ■ ව්‍යවසායකත්වයට අදාල සංවර්ධනය කළ යුතු පහසුකම් ඇගයිම.	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	150,000.00	75,000.00

අනු අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2018 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල (රු.)
4	නිපුණතාපාදක පුහුණු ක්‍රමයට වඩා ගැටළු පදනම් වූ ඉගෙනීමේ ක්‍රමයේ ඵලදායීතාවය පිළිබඳ අධ්‍යයනය මාරවිල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ විදුලි ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනය	■ ගැටළු පදනම් වූ ඉගෙනුම් සහ නිපුණතා පදනම් වල සාපේක්ෂ කාර්යය සොයා ගැනීම ■ විද්‍යුත් විෂය ඉගැන්වීමේ ඉගෙනුම් ක්‍රමය	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	150,000.00	75,000.00
5	වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පවත්වනු ලබන සැහැල්ලු ඉංජිනේරු පාඨමාලා සඳහා පුහුණු වන්නන්ගේ ආයතනික සාධක කෙරෙහි බලපෑම් පිළිබඳ අධ්‍යයනය	■ VTA හි විදුලි ඉංජිනේරුමය පාඨමාලාවල පුහුණුවන්නන් සඳහා පවතින භෞතික පහසුකම්වල බලපෑම් හඳුනා ගැනීම. ■ VTA හි විදුලි ඉංජිනේරුමය පාඨමාලාවල පුහුණුවන්නන් සඳහා පවත්නා උපදේශක ද්‍රව්‍යවල බලපෑම් හඳුනා ගැනීම. ■ VTA විදුලි ඉංජිනේරු පාඨමාලාවල පුහුණුවන්නන් සඳහා පුහුණු සැපයුම්වල බලපෑම තීරණය කිරීම.	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	150,000.00	75,000.00

අනු අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2018 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල (රු.)
6	වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් අතර ඉංග්‍රීසි භාෂාවේ සන්නිවේදන හැකියාවන් වර්ධනය කිරීම සඳහා කෙටිකාලීන හා දීර්ඝ කාලීන උපාය මාර්ගකුම පිළිබඳ අධ්‍යයනය	උපාධි අපේක්ෂකයන් අතර ඉංග්‍රීසි භාෂාවල සන්නිවේදන කුසලතා විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතා ඉටු කිරීම. ■ ඉංග්‍රීසි භාෂාවන්හි සන්නිවේදන කුසලතා හා කර්මාන්තයේ පවතින වර්තමාන වැඩසටහන් / අනෙකුත් ක්‍රියාකාරකම් අතර පරතර හඳුනා ගැනීම. ■ වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ සන්නිවේදන නිපුණතා සංවර්ධන වැඩසටහන් වැඩිදියුණු කිරීම. ■ වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යා උපාධි අපේක්ෂකයන් සඳහා සන්නිවේදන නිපුණතා සංවර්ධනය සඳහා කෙටි / දීර්ඝකාලීන සැලසුම් ඉදිරිපත් කිරීම	වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය	145,000.00	72,500.00
7	රැකියා අවස්ථා සඳහා NVQ ඩිප්ලෝමා සිසුන්ගේ සාමාන්‍ය (මෘදු) හැකියාවේ ඇති කාර්ය සාධන පරතරය අපේක්ෂා කිරීම පිළිබඳ අධ්‍යයනය	■ ඩිප්ලෝමා ශිෂ්‍යයන් හා සේවා යෝජකයාගේ රැකියා අපේක්ෂාවන් හඳුනාගැනීම. ■ ඔවුන්ගේ වැඩි දියුණු කිරීමට අවශ්‍ය නිපුණතා හඳුනා ගැනීම සහ මෙම අපේක්ෂාවන් රැකියා වෙළඳපොළවල අවශ්‍යතා හා අපේක්ෂාවන් සමඟ සංසන්දනය කළ හැකි ආකාරය හඳුනාගැනීම ■ NVQ 5 හි පවතින දැනට පවතින සේවානියුක්තියේ මොඩියුලයන් වලංගු කිරීම සඳහා	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය සාගර විශ්වවිද්‍යාලය	150,000.00	75,000.00

අනු අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2018 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල (රු.)
8	කුරුණෑගල දිස්ත්‍රික්කයේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ ආකර්ෂණය ප්‍රවර්ධනය කරන සාධක විශ්ලේෂණය පිළිබඳ අධ්‍යයනය	■ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු සිසුන්ගේ ආකර්ෂණය ප්‍රවර්ධනයකර ඇති සාධක හඳුනා ගැනීම. ■ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ සිසුන්ගේ ආකර්ෂණයට බලපාන සාධක හඳුනා ගැනීම ■ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ආකර්ෂණය පිළිබඳව දෙමව්පියන්ගේ ආකල්ප හඳුනා ගැනීම. ■ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආකර්ෂණය පිළිබඳ පාසල්වල ආකල්ප හඳුනාගැනීම ■ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ආකර්ශනීයතාවය මත සේවායෝජකයින්ගේ ඉල්ලීම හඳුනාගැනීම	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ අධිකාරිය	150,000.00	75,000.00
9	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ අධිකාරියට අයත් ආයතනවල පවත්වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) ඩිප්ලෝමා පාඨමාලාව කාන්තාවන්ගේ ආර්ථික බලගැන්වීම හා ශ්‍රම වෙළඳපොළ තුළ කාන්තා ශ්‍රම බලකාය වැඩිදියුණු කිරීම සඳහා දායක වන්නේ කෙසේද යන්න සොයාබැලීම පිළිබඳ අධ්‍යයනය.	■ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය සැපයීම සඳහා DTET භාවිතා කරන වත්මන් උපාය මාර්ගවල ක්‍රියාකාරිත්වය සොයා බැලීම සහ තොරතුරු තාක්ෂණ ශ්‍රම බලකායට දායකත්වය ■ ශ්‍රම වෙළෙඳපොළ ඉල්ලුම හා සැපයුම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ වර්තමාන භාවිතයන් සම්බන්ධ ගැටළු මොනවාදැයි සොයා බැලීම	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ අධිකාරිය	150,000.00	75,000.00

අනු අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2018 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල (රු.)
10	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පවත්වනු ලබන ආධුනිකත්ව පුහුණු පාඨමාලාවල ඵලදායීතාවය ඇගයීම (විශේෂඥ සූපවේදී ක්ෂේත්‍රය සඳහා)	■ රැකියා පුහුණුව ලබා ගැනීම සඳහා ස්ථාපිත කර ඇති යාන්ත්‍රණය පිළිබඳ ගැටළු පරීක්ෂා කිරීම ■ රැකියා පුහුණුවීම් කටයුතු පිළිබඳ ඇති අදාළත්වය හඳුනා ගැනීම සඳහා ■ ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා පුහුණුවන්නන් සහ කර්මාන්තශාලා වලින් ලද ප්‍රතිපෝෂක විශ්ලේෂණය කිරීම	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය	112,000.00	56,000.00
11	ශ්‍රී ලංකාවේ සහ සිංගප්පූරුවේ වෘත්තීය මාර්ගෝපදේශන පද්ධතිය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනය	■ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ වෘත්තීය මාර්ගෝපදේශන අවස්ථා වල වර්තමාන තත්ත්වය සමාලෝචනය කිරීම. ■ ශ්‍රී ලංකාව තුළ සුදුසු පුහුණු වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයක් හඳුනා ගැනීම සඳහා වෙනත් රටවල වෘත්තීය මාර්ගෝපදේශන යාන්ත්‍රණයන් අධ්‍යයනය කිරීම (බෙන්චිමන් කිරීම) ■ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා ප්‍රතිපත්ති නිර්දේශ කිරීම	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ අධිකාරිය	150,000.00	75,000.00

අංකය	පර්යේෂණ මාතෘකාව	පර්යේෂණයේ අරමුණු	පර්යේෂණ කණ්ඩායම	අනුමත කරන ලද මුදල (රු.)	2018 වර්ෂයේදී ගෙවීමට නියමිත මුදල (රු.)
12	උතුරු පළාතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමේ කර්මාන්තගත පුහුණුවේ කාර්යක්ෂමතාව ඇගයීම පිළිබඳ අධ්‍යයනය	■ ඉල්ලුම හඳුනා ගැනීම - රැකියා වෙළඳපොළ තුළ සූපවේදී ආධුනිකයින් සඳහා ■ ජාතික ආධුනිකත්ව ආයතනය විසින් පවත්වනු ලබන සමාප්තියේ පාඨමාලා වල වලංගුභාවය හඳුනා ගැනීම ■ කාර්මික වෙළඳාම තුළ ආධුනිකයා හඳුනාගැනීම. ■ පාඨමාලාවල සංවර්ධනය වන අංශ හඳුනාගැනීම.		150,000.00	75,000.00
13	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පෙදරේරු හා වඩු වැඩ පාඨමාලා පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ ආකල්ප පිළිබඳ අධ්‍යයනය	ප්‍රාථමික අරමුණු - ■ VTA පාර්ශ්වකරුවන් අතර ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පෙදරේරු හා වඩු කර්මාන්තයේ වෘත්තීන් පිළිබඳ අවබෝධය හඳුනා ගැනීම. ද්විතියික අරමුණු - ■ රැකියා වල යෝග්‍යතාව සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතුවලදී ප්‍රතිකර්ම ක්‍රම වේදැයි යන්න හඳුනා ගැනීම ■ ආයතනික මට්ටමින් උසස් තත්ත්වයේ ක්‍රියාකාරිත්වයන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් වල ගුණාත්මකභාවය සහ අදාළත්වය පිළිබඳ නිර්දේශය ඉදිරිපත් කිරීම සහ අවසානයේ සොයාගැනීම් සුදුසු ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත මාර්ගෝපදේශ සැපයීම.	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	150,000.00	75,000.00
මුළු එකතුව				**1,887,000.00**	**943,500.00**

2018 වර්ෂයේදී ආරම්භකල පර්යේෂණ අධ්‍යයන සඳහා රු. මිලියන 0.5 ක මුදලක් වැයවිය. ඒ අනුව, 2018 වර්ෂයේදී අනුමත ප්‍රතිපාදන වලින් 50% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි. ඉතිරි මුදල පර්යේෂණ අධ්‍යයන නිමකිරීමෙන් අනතුරුව 2019 වර්ෂයේදී ගෙවා නිමකිරීමට නියමිතය.

5.3.2 පර්යේෂණ වැඩමුළු පැවැත්වීම

තාක්ෂණික හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු විධිමත් කිරීමේ අරමුණින් පර්යේෂණකරුවන් පුහුණු කරවීමේ වැඩමුළු 05 ක් පවත්වන ලදී. ඒ සඳහා 2018 වර්ෂයේදී රු. මිලියන 0.717 ක මුදලක් වැයකරන ලදී.

5.3.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2018 (AIP 2018) අනුව ලබාගත් සමස්ථ ප්‍රගතිය

- මෝටර්රථ කාර්මික ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම යාවත්කාලීන කිරීම ආරම්භ කිරීම
- පෞද්ගලික අංශයට අයත් ආයතන 08 ක පාඨමාලා 09 ක් සඳහා මූල්‍යාධාර ප්‍රදානය කිරීම
- 2018 වර්ෂය සඳහා පර්යේෂණ අධ්‍යයන 13 ක් ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය අංශයේ පුහුණු ආයතන 46 ක් හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතන 245 ක් ලියාපදිංචි කිරීම.
- රාජ්‍ය අංශයේ පුහුණු ආයතන 249 ක් හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතන 133 ක ලියාපදිංචිය අළුත් කිරීම.
- රාජ්‍ය අංශයේ පුහුණු පාඨමාලා 272 ක් හා පෞද්ගලික අංශයේ පුහුණු පාඨමාලා 206 ක් ප්‍රතිනය කිරීම සඳහා ඇගයීම.
- රාජ්‍ය අංශයේ පුහුණු පාඨමාලා 377 ක් හා පෞද්ගලික අංශයේ පුහුණු පාඨමාලා 127 ක ප්‍රතිනය යාවත්කාලීන කිරීම සඳහා ඇගයීම.
- තත්ත්ව කළමනාකරණ පද්ධති පුහුණු ආයතන තුළ ස්ථාපිත කිරීම යටතේ බාහිර විගණන 115 ක් සිදුකිරීම.
- රාජ්‍ය අංශයේ ජාතික නිපුණතා සහතික 37089 ක් හා පෞද්ගලික අංශයේ ජාතික නිපුණතා සහතික 15980 ක් මුද්‍රණය කිරීම.
- TVEC තොරතුරු සංග්‍රහය පිළියෙල කිරීම.
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයක් නිකුත් කිරීම.
- ජාතික නිපුණතා සම්මත 49 ක් අළුතින් පිළියෙල කිරීම හා ජාතික නිපුණතා සම්මත 31 ක් සංශෝධනය කිරීම.
- විෂය නිර්දේශ 36 ක් අළුතින් පිළියෙල කිරීම හා විෂය නිර්දේශ 29 ක් සංශෝධනය සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- ජාතික නිපුණතා සම්මත 19 ක් හා විෂය නිර්දේශ 12 ක් පරිවර්ථනය කිරීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව පිළිබඳව දැනුවත් කිරීමේ ප්‍රදර්ශන 02 ක් පැවැත්වීම.
- නිපුණතා පාදක ඇගයීම් කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 10 ක් පැවැත්වීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 3 හා 4 සඳහා දීප ව්‍යාප්ත පොදු විභාග 14 ක් සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 5 හා 6 සඳහා පොදු විභාග 07 ක් පැවැත්වීමට කටයුතු කිරීම.

මෙම අංශය 2019 වන වර්ෂය සඳහා පර්යේෂණාවලට සමගාමීව කෙටි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, පාර්ලිමේන්තු පනතට අනුව සංවර්ධන සැලසුම් (Development Plan) සකස්කිරීමට ද නියමිතය. තවද, මෙම ක්‍රියාවලියේද SDG ඉලක්ක, ජාතික වෘත්තීය පුහුණු ප්‍රතිපත්ති සහ මහබැංකු වාර්ථා යෝජනා ඉහත සැලසුම් සඳහා මූලාශ්‍ර ලෙස ද යොදාගැනීමට නියමිතය.

6.0 පාඨමාලා ලියාපදිංචි, පිළිගැනීම් හා තත්ත්ව කළමනාකරණ පද්ධති අංශය

1990, අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව සහ වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය උදෙසා වූ සංවර්ධන සැලැස්මට අනුව, (1995 සැප්තැම්බර් 05 දින අංක 887/8 දරණ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සියළු වෘත්තීය පුහුණු ආයතන සඳහා පහත පරිදි අදියර තුනකින් යුතු තත්ත්ව සුරක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබයි.

1. වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය
2. පාඨමාලා ප්‍රතිනය - NVQ සහතික ලබාදීම සඳහා
3. තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම හා සහතිකකරණ

ඉහත කරුණු 3 ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශයේ නිලධාරීන් 13 දෙනෙකුගේ සංයුක්තියකින් සමන්විත අතර, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් 02, සහකාර අධ්‍යක්ෂවරු 03 වැඩසටහන් සම්බන්ධීකරණ නිලධාරීන් 02 සංවර්ධන නිලධාරීන් 02, කළමනාකරණ සහකාරවරුන් 02 සහ කාර්යාල කාර්යය සහායකයකුගෙකු මීට ඇතුලත් වේ.

6.1 වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය

වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය නෛතික අවශ්‍යතාවක් වන අතර,රට තුල ක්‍රියාත්මකවන සියළු වෘත්තීය පුහුණු ආයතන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි විය යුතුය. (ඉහත සඳහන් කරන ලද පනතට අනුව) ලියාපදිංචිය සඳහා ආයතනයන්හි අවම යටිතල පහසුකම්වල ප්‍රමාණවත්බව, පුහුණු උපකරණ, උපදේශකයන්ගේ සුදුසුකම්, පුහුණුව ලබාදීමේ ක්‍රමවේදය, විෂයමාලාවන්හි ප්‍රමාණවත්බව, පිළිබඳ විමර්ශණය කර ඒ අනුව වර්ෂ දෙකක කාලයකට කොමිෂන් සභාව එම ආයතන සඳහා ලියාපදිංචිය ලබාදේ.

2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කොමිෂන් සභාව 760 ආයතන ප්‍රමාණයක් ලියාපදිංචි සඳහා ඇගයීම් කිරීම ඉලක්ක ගත කර ඇති අතර ආයතන 673 ප්‍රමාණයක් ඇගයීමට ලක්කර ඇත.

ආයතන ලියාපදිංචිය සඳහා ඇගයීම් කිරීම් (නව සහ යාවත්කාලීන) වර්ගීකරණයට අනුව සංඛ්‍යා පහත වගුවෙහි දක්වා ඇත.

	ආයතන ප්‍රමාණය		එකතුව
	නව ලියාපදිංචි කිරීම්	ලියාපදිංචිය යාවත්කාලීන කිරීම්	
(ඉලක්ක ගත) ඇගයීම් ප්‍රමාණය	360	400	760
අයදුම්පත් ලද සංඛ්‍යාව	309	400	709
ඇගයීම් කල ප්‍රමාණය	291	382	673

2018 වර්ෂයේ ඇගයීම් ප්‍රමාණය ඉලක්ක ගත සංඛ්‍යාවට වඩා අඩුවක් පෙන්වුවද 2017 වසරේ ඇගයීම් වලදි හඳුනා ගත් අඩුපාඩු සපුරාලීමෙන් අනතුරුව මුලු ආයතන 751 ක් 2018 වර්ෂයේ මෙම කොමිෂන් සභාව මඟින් ලියාපදිංචි කරන ලද අතර එය පහත වගුවෙහි දක්වා ඇති පරිදි හිමිකාරිත්වය අනුව දැක්වේ.

ආයතන වර්ගය හිමිකාරිත්වය	ලියාපදිංචි කල ප්‍රමාණය (නව)	ලියාපදිංචි කල ප්‍රමාණය (යාවත්කාලීන)
රාජ්‍ය ආයතන	20	199
ව්‍යවස්ථාපිත හෝ සංස්ථා, මණ්ඩල	42	88
පුද්ගලික	157	245
එකතුව	119	532

2018 වර්ෂයේ අවසානයේ වෘත්තිය පුහුණු ආයතන 1184 ප්‍රමාණයන් ලියාපදිංචිය වලංගුව පවතින ලද අතර එය පහත වගුවේ දක්වා ඇති පරිදි හමිකාරිත්වය අනුව දැක්වේ.

1. රාජ්‍ය ආයතන / ව්‍යවස්ථාපිත සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල 545
2. පෞද්ගලික / රාජ්‍ය නොවන ආයතන 639

ලියාපදිංචිය ලත් වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම

වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන මඟින් පුහුණුව ලබන ලද සහතිකපත්‍ර ලාභීන් විදේශ ගත වීම් සඳහා අදාල පුහුණු ආයතනයන්හි ලියාපදිංචිය තහවුරු කිරීමේ ලිපි විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නිකුත් කිරීම මෙම අංශය සිදු කරනු ලැබේ. එවැනි ලිපි 916 කට වැඩි සංඛ්‍යාවක් 2018 වසර තුල විදේශ අමාත්‍යාංශය වෙත නිකුත් කර ඇත.

6.2 NVQ සහතික ලබා දීම සඳහා පාඨමාලා ප්‍රතීතනය

ජාතික වෘත්තිය සුදුසුකම් රාමුව 2004 වර්ෂයේ හඳුන්වා දෙන ලදි. NVQ සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා ජාතික නිපුණතා සම්මත සකස් කර තිබිය යුතුය. එම නිපුණතා සම්මත අනුව ජාතික විෂය මාලාවන් සකස් කරන අතර එම විෂය මාලා අනුව නිපුණතා පාදන ක්‍රමය යටතේ පුහුණු කටයුතු සිදු කරන පාඨමාලාවන් ප්‍රතීතනය කිරීම මෙම කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලැබේ.

2018 වර්ෂය තුල සිදු කරන ලද පාඨමාලා ප්‍රතීතනය ඇගයීම් ප්‍රමාණය පහත වගුවේ සඳහන් පරිදි වේ. ප්‍රතීතනය ලබා ඇති පාඨමාලා හරහා පුහුණුවක් ලබන පුහුණුවන්නන් අවසන් ඇගයීම මෙම කොමිෂන් සභාව මඟින් සිදු කරන අතර එහි ප්‍රතිඵල අනුව NVQ සුදුසුකම් ප්‍රදානය කරනු ලැබේ.

	පාඨමාලා ප්‍රතීතන ඇගයම් ප්‍රමාණය		එකතුව
	නව	යාවත්කාලීන	
ඉලක්ක ගත ඇගයිම් ප්‍රමාණය	500	400	900
ප්‍රතීතන ඇගයිම් සිදු කල ප්‍රමාණය	478	504	982

2018 වර්ෂය තුල මෙම කොමිෂන් සභාව මඟින් ප්‍රතීතනය කරන ලද මුලු පාඨමාලා සංඛ්‍යාව 926 වන අතර එය පහත දක්වා ඇති වගුවේ පරිදි වේ.

ආයතන වර්ගය හිමිකාරත්වය	පාඨමාලා ප්‍රතීතන සංඛ්‍යාව (නව)	පාඨමාලා ප්‍රතීතන සංඛ්‍යාව (යාවත්කාලීන)
රාජ්‍ය ආයතන	535	120
ව්‍යවස්ථාපිත හෝ සංස්ථා මණ්ඩල	73	14
පෞද්ගලික	145	39

6.3. වෘත්තීය පුහුණු ආයතන තුල තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය සහ සහතිකකරණය.

පහත සඳහන් වෘත්තිය පුහුණු ආයතන තුල තත්ත්ව කළමණාකරණ පද්ධති ස්ථාපනය කිරීම සඳහා බාහිර තත්ත්ව විගණනය කිරීම මෙම සභාව මඟින් සිදු කරනු ලැබේ. 2018 වර්ෂයේදී පුහුණු ආයතන 115 එසේ විගණනය කරනු ලබන ලදී. පහත දක්වා ඇති පුහුණු ආයතන තත්ත්ව කළමණාකරණය ස්ථාපනය සඳහා සහතිකකරණය ලබා දීම සිදු කරන ලදී.

1. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - පලාපොත
2. ජාතික වෘත්තීය පුහුණු ආයතනය - මිරිජ්ජවිල
3. ජාතික තරුණාසේවා සභාව - ආණමඩුව
4. ටෙක් විෂන් ජාත්‍යන්තර පුහුණු විද්‍යාලය - ගලගෙදර
5. SOS ශ්‍රී ලංකා ළමා ග්‍රාම - මොණරාගල
6. තාක්ෂණ විද්‍යාලය - අනුරාධපුර
7. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - ගෝමරන්කඩවල
8. තාක්ෂණ විද්‍යාලය - රත්නපුර
9. ප්‍රමාණ සමීක්ෂණ තාක්ෂණ ආයතනය - කොළඹ
10. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කළුබෝවිල
11. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය -අලයාපත්තුව
12. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - දිවිතොටවෙල
13. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - හල්දුමුල්ල
14. චාම්වේ (ප්‍රයිවට්) ලිමිටඩ් - නුගේගොඩ
15. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - පන්නිපටිය
16. ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය (RC) - යාපනය
17. තාක්ෂණ විද්‍යාලය - මන්නාරම
18. වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය -මාතර
19. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - රොක්හිල්,බදුල්ල
20. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - ඇල්පිටිය
21. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මාලඹේ
22. ප්‍රීමා සිලෝන් ලිමිටඩ් - රාජගිරිය
23. විත් - ස්ටෝන් ස්කූල් ඔෆ් කුලිනරි ආර්ට් (පුද්ගලික) සමාගම - නුගේගොඩ.

24. ජාතික වෘත්තීය පුහුණු ආයතනය - මිරිජ්ජවිල

25. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මාකඳුර

26. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - තලහගම

27. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - තිහගොඩ

28. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - යක්කලමුල්ල

29. ජාතික වෘත්තීය පුහුණු ආයතනය - නාරාහේන්පිට

30. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වැලිපිටිය

31. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය - කොළඹ 07

32. නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානය වෘත්තීය පුහුණු අධිකාරිය - තවලම

33. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කොග්ගල

34. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - IT Hub කොටුවෙගොඩ - මාතර

35. තාක්ෂණ විද්‍යාලය - හෝමාගම

36. ශ්‍රී කාවන්තිස්ස වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය- තිස්සමහාරාමය

37. කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනය - ජල කළමනාකරණය - කොත්මලේ

38. මියානි තාක්ෂණික ආයතනය - මඩකලපුව

39. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - අඟුණාකොළ පැලැස්ස

40. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මැදමුලන

41. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - බල්ලපාන - ගලිගමුව

42. වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය - අතුරුගිරිය

6.4. වෘත්තීය පුහුණු ආයතන තුල තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය සහ සහතිකකරණය.

පහත දක්වා ඇති පුහුණු ආයතන තත්ත්ව කළමණාකරණය ස්ථාපනය සඳහා සහතිකකරණය ලබා දීම සඳහා නිර්දේශ කර ඇති අතර එය සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය.

1. ජාතික තරුණසේවා සභාව - එරමිණියාය
2. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පරන්තන්
3. ටෙක්නිකියු ජාත්‍යන්තර ආයතනය - කොළඹ 07
4. රණවිරු වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වත්තල
5. ලිට්ල් බර්ඩ් පුහුණු ආයතනය - රත්මලාන
6. ජාතික තරුණසේවා සභාව - හලාවත
7. කෘෂිකර්ම යාපනය විදුහල ආයතනය - යාපනය
8. දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - සාරගම - කුරුණෑගල
9. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මහියංගනය
10. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - අඟුණකොළපැලැස්ස
11. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - කුරුවිට
12. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - නාවලපිටිය
13. ජාතික තරුණසේවා සභාව - කහටගස්දිගිලිය
14. ජාතික තරුණසේවා සභාව - අනුරාධපුරය
15. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - අංගම්මන
16. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - යායාවත්ත
17. ප්‍රලිස්ටන් අන්තර්ජාතික (පුද්ගලික) සමාගම - පානදුර
18. තාක්ෂණ විද්‍යාලය - හසලක
19. තාක්ෂණ විද්‍යාලය - කුලියාපිටිය
20. දොන්බොස්කෝ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - නාරම්මල
21. තාක්ෂණ විද්‍යාලය - කුරුණෑගල

මීට අමතරව පුහුණු මධ්‍යස්ථාන තුල තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා එක්දින වැඩසටහන් 11 ක් පවත්වා ඇත. මේ සඳහා වෘත්තීය පුහුණු ආයතනයන්හි නිලධාරීන් 400 ආසන්න ප්‍රමාණයක් සහභාගී වී ඇත.

2018 වර්ෂයේදී නිලධාරීන් 04 දෙනෙකු (Lead Auditors) ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයේ විගණනක සුදුසුකම ලබා ඇත. දැනට වෘත්තීය විගණනකවරුන්ගේ අවශ්‍යතාවයක් පවතින අතර, ඒ අනුව QMS විගණන සංසදයේ විගණකවරු 35 දෙනෙකු සක්‍රීය සේවයේ සිටී. ඒ සඳහා තවත් නිලධාරීන් පුහුණු කිරීමට නියමිතය.

2018 වර්ෂය තුල කොමිෂන් සභාව ආයතන ලියාපදිංචිය පාඨමාලා ප්‍රතිනතය සහ අදාල කටයුතු තුලින් උපයා ඇති මුදල පහත අයුරුවේ.

පුහුණු මධ්‍යස්ථාන ලියාපදිංචි ගාස්තු ආදායම	- රු.	1,932,400.00
ප්‍රතිනත ගාස්තු ආදායම	- රු.	2,098,400.00
ශිෂ්‍ය වාර්තා පොත් විකිණීමෙන් (Student Record books)	- රු.	2,401,425.00
තත්ත්ව කළමනාකරණ (QMS) සහතික පත්‍ර නිකුත් කිරීම	- රු.	3,340,000.00
පුහුණු ආයතන ලියාපදිංචි තහවුරු කිරීමේ ලිපි	- රු.	1063,750.00
ලියාපදිංචි කල් ඉකුත්වීමේ දඩ	- රු.	6,400.00
මෙම මුදල භාණ්ඩාගාරයට බැරකර ඇත	**- රු.**	**10,842,375.00**

7.0 ජාතික නිපුණතා සම්මත, විෂය මාලා සහ ජාතික වෘත්තීය සුදුකම් අංශය

7.1 ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීන්ට අදාළව ජාතික නිපුණතා සම්මතයන් සහ ජාතික විෂය මාලාවන් සකස් කිරීම ප්‍රධාන අවශ්‍යතාවයකි. ඒ අනුව 2018 වසරේ පහත සඳහන් නව ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කරන ලදුව ඒවා බලලත් කරන ලදී.

7.1.1 කර්මාන්ත ක්ෂේත්‍ර සහා මගින් යෝජනා වූ උපදෙස් මත විෂය මාලාවන්ද ඇතුලත්ව සකස් කරන ලද නව ජාතික නිපුණතා සම්මත

- කන්ටේනර් කාර්මික ශිල්පී - 3,4 මට්ටම
- වාහන දුම් පරීක්ෂණ තාක්ෂණ ශිල්පී - 3,4 මට්ටම
- ඇලුමිනියම් පිළිසැකසුම්කරු සමග අභ්‍යන්තර අලංකරණය - 4 මට්ටම

7.1.2 සකස් කරන ලද නව ජාතික නිපුණතා සම්මත

- හෝමියෝපත් ඩිස්පෙන්සර් - 3 මට්ටම
- කනිෂ්ඨ ආරක්ෂක නිලධාරී - 3 මට්ටම
- ගුවන් ටිකට්පත් වෙන් කිරීමේ නියෝජිත - 4 මට්ටම
- ගමනාගමන සහායක/ ගමනාගමන අධීක්ෂක - 3,4 මට්ටම
- දුර ගමන / පයින් යන දුර ගමන සඳහා මග පෙන්වන්නා - 3,4 මට්ටම
- ජලබර මෙහෙයුම්කරු - 4 මට්ටම
- පන් ආශ්‍රිත නිර්මාණ ශිල්පී - 4 මට්ටම
- පත්‍ර හා තෘණ ආශ්‍රිත අමු ද්‍රව්‍ය සැකසුම්කරු - 4 මට්ටම
- කේක් අලංකරණ ශිල්පී - 4 මට්ටම
- ළමා සුරකුම් මධ්‍යස්ථාන මෙහෙයුම් - 2,3,4 මට්ටම
- ළමා සුරකුම් මධ්‍යස්ථාන කළමනාකරු - 5,6 මට්ටම
- මනෝ විද්‍යාත්මක උපදේශනය - 5,6 මට්ටම
- දෘෂ්ඨි විශේෂඥ - 5 මට්ටම
- සූර්ය වෝල්ටියතා පද්ධති කාර්මික ශිල්පී - 3,4 මට්ටම
- 3D පේනරලිස්ට් - 4 මට්ටම
- රබර් පැසුරුම් යන්ත්‍ර ක්‍රියාකරු - 3,4 මට්ටම
- රබර් පැසුරුම් තාක්ෂණික ශිල්පී - 4 මට්ටම
- මනාලියන් හැඩ ගැන්වීමේ ශිල්පී - 3,4 මට්ටම
- මදුරු මර්ධන ක්ෂේත්‍ර නිලධාරී - 3,4 මට්ටම

- පෙට්‍රෝලියම් පාරිභෝගික සේවා සහයක - 3,4 මට්ටම
- නාවික යන්ත්‍රෝපකරණ නඩත්තු තාක්ෂණය - 5 මට්ටම
- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය - 6 මට්ටම
- ශාක පටක රෝපණ රසායනාගාර සහයක - 3,4 මට්ටම
- මාධ්‍යවේදී (මුද්‍රිත මාධ්‍ය) - 3,4 මට්ටම
- මාධ්‍යවේදී (විකාශන) - 4 මට්ටම
- සහය නිෂ්පාදක (මාධ්‍ය නිෂ්පාදන) - 4 මට්ටම
- නිෂ්පාදන සහකාර (විද්‍යුත් මාධ්‍ය) - 3,4 මට්ටම
- ඉදිරිපත් කරන්නා - 3,4 මට්ටම

7.1.3 සකස් කරන ලද නව විෂය මාලා

- හෙද - 6 මට්ටම
- ජලජීව් වගා ශිල්පී - 3,4 මට්ටම
- බතික් නිර්මාණකරු - 3 මට්ටම
- රැකවරණය සපයන්නා - 3,4 මට්ටම
- සත්ත්ව වගා සහයක - 3,4 මට්ටම
- දන්ත ශල්‍ය හෙද සහයක - 4 මට්ටම
- ඩීසල් පොම්ප කාමර කාර්මික ශිල්පී - 2,3,4 මට්ටම
- විදුලි සෝපාන කාර්මික ශිල්පී - 3,4 මට්ටම
- ගිනි නිවන්නා - 3,4 මට්ටම
- මසුන් අල්ලන යාත්‍රා ක්‍රියාකරු - 4 මට්ටම
- පේෂ කර්මාන්ත ශිල්පී - 2,3,4 මට්ටම
- අභ්‍යන්තර අලංකරණ ශිල්පී - 4 මට්ටම
- රසායනාගාර සහායක - 3,4 මට්ටම
- යන්ත්‍ර ක්‍රියාකරු (බෙවරේජ් කර්මාන්තය) - 2,3,4 මට්ටම
- රිගර ක්‍රියාකරු - 3 මට්ටම
- ආරක්ෂිත සහ නිරීක්ෂණ කැමරා කාර්මික ශිල්පී - 3,4 මට්ටම
- ටයිල් අතුරන්නා - 3,4 මට්ටම
- වෙබ් නිර්මාණ ශිල්පී - 4 මට්ටම
- සත්ත්ව නිෂ්පාදන තාක්ෂණය - 5,6 මට්ටම
- ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ නඩත්තු තාක්ෂණය - 5,6 මට්ටම

7.2 පහත සඳහන් ජාතික නිපුණතා සම්මත හා විෂය මාලා යාවත්කාලීන කිරීමෙන් අනතුරුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක කරන ලදී.

7.2.1 පහත සඳහන් ජාතික නිපුණතා සම්මත හා විෂය මාලා යාවත්කාලීන කිරීමෙන් අනතුරුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක කරන ලදී.

- බෝට්ටු (පිටක) කාර්මික ශිල්පී - 3,4 මට්ටම
- මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී - 3,4 මට්ටම
- සැලසුම් ශිල්පී - 3,4 මට්ටම
- ශීතකරණ හා වායුසමීකරණ ශිල්පී - 3,4 මට්ටම
- මල් සැකසුම් ශිල්පී - 3,4 මට්ටම
- මෝස්තර සාදන්නා - 3,4 මට්ටම
- කොණ්ඩා සැකසුම්කරු - 3,4 මට්ටම
- චිත්‍රක සැලසුම් ශිල්පී - 4 මට්ටම
- පෙර පාසල් ගුරු - 4 මට්ටම

7.2.2 යාවත්කාලීන කරන ලද නිපුණතා සම්මත සහ විෂය මාලා.

- ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්ප - 4 මට්ටම
- විදුලි කාර්මික - 4 මට්ටම
- ගොඩනැගිලි ඉදිකරන්නා - 3 මට්ටම
- හෙද සහයක - 4 මට්ටම
- වෘත්තීය සූපවේදී - 2,3,4 මට්ටම

7.2.3 යාවත්කාලීන කරන ලද විෂය මාලා

- පරිගණක දෘඩාංග ශිල්පී - 4 මට්ටම
- ගොඩනැගිලි ඉදිකරන්නා - 2,3,4 මට්ටම
- සැලසුම් ශිල්පී - 4 මට්ටම
- පිළිගැනීමේ නිළධාරී - 3,4 මට්ටම
- ගබඩා භාරකරු - 2,3,4 මට්ටම
- රබර් පැසුරුම් යන්ත්‍ර ක්‍රියාකරු - 3,4 මට්ටම
- ශීතකරණ හා වායු සමීකරණ සේවා සපයන්නා - 2,3 මට්ටම

- පොලිමර් තාක්ෂණය - 5,6 මට්ටම
- වඩු කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) - 3,4 මට්ටම
- ලිතෝ යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී - 2,3,4 මට්ටම
- කර්මාන්ත ක්ෂේත්‍රයේ ජලනල කාර්මික ශිල්පී - 3,4 මට්ටම
- ගෘහස්ථ විදුලි උපකරණ පිළිසකර ශිල්පී - 3,4 මට්ටම
- රෙදි කපන්නා - 3 මට්ටම
- සම්භාණ්ඩ නිෂ්පාදන ශිල්පී - 3,4 මට්ටම
- ලේකම් - 3,4 මට්ටම

7.3 සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා

7.3.2 සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත

- කොණ්ඩ සැකසුම් ශිල්පී
- ඇවිදීමේ මාර්ගෝපදේශක
- පෙර පාසල් ගුරු
- සූර්ය වෝල්ටීයතා පද්ධති කාර්මික ශිල්පී
- විදුලි කාර්මික ශිල්පී (ගෘහස්ථ හා කර්මාන්ත)
- ආගන්තුක සබඳතා නියෝජිත
- පොත් බඳින්නා

7.3.3 සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද විෂයමාලා

- පරිගණක ප්‍රකාශන ශිල්පී
- ත්‍රී වීලර් කාර්මික ශිල්පී

7.4 පහත සඳහන් ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලදී.

7.4.1 දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත.

- පෙර පාසල්
- කංකානම්
- තීන්තකරු (ගොඩනැගිලි)
- විදුලි කාර්මික(ගෘහස්ථ/කාර්මාන්ත)
- පෙට්‍රෝලියම් පාරිභෝගික සේවා සහයක
- ඇඳුම් මසන්නා

7.4.2 දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලද විෂය මාලා.

- සත්ත්ව වගා සහයක

7.5 පහත සඳහන් විෂයමාලාවන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලදී.

- භූ දර්ශන ශිල්පී

7.6 ජාතික වෘත්තීය සුදුසුකම් නොවන පාඨමාලාවන් හදාරන ලද අයදුම්කරුවන්හට ජාතික වෘත්තීය සුදුසුකම් සමාන සහතික නිකුත් කිරීම සඳහා වෘත්තීය සමාලෝචන පරීක්ෂණ සිදු කරන ලද අතර එමඟින් සමත් වූවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කිරීමේ සහතික නිකුත් කරන ලදී.

පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	පැවැත්වූ වෘත්තීය සමාලෝචන සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	සමාන සහතික ලබාදුන් සංඛ්‍යාව
ජාතික තාක්ෂණ සහතික පත්‍රය/කර්මාන්ත තාක්ෂණ ජාතික සහතික පත්‍රය (සිවිල් ඉංජිනේරු)	5 වන මට්ටම	08	58	49
ජාතික තාක්ෂණ සහතික පත්‍රය (විදුලි හා විද්‍යුත් ඉංජිනේරු)	5 වන මට්ටම	01	04	02
ජාතික තාක්ෂණ සහතික පත්‍රය(ප්‍රමාණ සමීක්ෂණ)	5 වන මට්ටම	01	07	03
ජාතික තාක්ෂණාය සහතික පත්‍රය (යාන්ත්‍රික ඉංජිනේරු)	5 වන මට්ටම	01	07	07

7.6.2 තවද පහත දක්වා ඇති සහතික පත්‍ර සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සමාන කිරීමේ සහතික නිකුත් කිරීම සිදුකර ඇත.

පාඨමාලාවේ නම	ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම	නිකුත් කරන ලද සමාන කිරීමේ සහතික සංඛ්‍යාව
තොරතුරු සන්නිවේදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	24
කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	01
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	13
ප්‍රමාණ සමීක්ෂණ ජාතික ඩිප්ලෝමාව	5 වන මට්ටම	10

පළපුරුද්ද සහිත තාක්ෂණ සහතික පත්‍ර ලාභීන් 198 දෙනෙකු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව ලිපි නිකුත් කරන ලදී.

7.7 ජාතික නිපුණතා සම්මත හා විෂය මාලාවන්හි පිටපත් සැකසීම.

සකස් කර ඇති ජාතික නිපුණතා සම්මත හා ඒවායේ ලේඛන ඇතුලත් මෘදු පිටපත් සහිත CD තැටි විකිණීම මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. 2018 වසර තුළ දී මෙම CD තැටි 1308 ක් විකුණා ඇති අතර එමගින් රු.654,000.00 ක ආදායමක් උපයා ඇත.

7.8 අන්තර් ආයතනික ජාතික වෘත්තීය සුදුසුකම් මෙහෙයුම් කමිටු රැස්වීම පැවැත්වීම.

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීම සාමූහික තීරණ ගැනීම නව යෝජනා ක්‍රියාත්මක කිරීම අරමුණු කර ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමවේදය ක්‍රියාත්මක කරන රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන් හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කමිටුවක් පිහිටුවා ඇත.2018 වසර තුළ එම කමිටු රැස්වීම් 08 ක් පවත්වා ඇත.

8. තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන අංශය

8.1 හැඳින්වීම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ ජූලි මාසයේ දී ජාතික වෘත්තීය සුදුසුකම් අංශයේ ඇගයීම් හා පාලන අංශය NVQ සහතිකපත් අංශය ඒකාබද්ධ කරමින් තත්ත්ව ආරක්ෂණ හා ඇගයීම් පාලන අංශය ස්ථාපනය කරන ලදී. ඒ සඳහා ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනේ මූල්‍ය දායකත්වය ලබා දෙනලදී.

ඒ අනුව මෙම අංශය අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂවරුන් 04, වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් 02, සංවර්ධන නිලධාරිවරයකු, කළමණාකාර සහකාරවරු 03 හා පරිගණක යෙදවුම් සහකාර 03 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම මිනිස් සම්පත් උපයෝගී කර ගනිමින් 2018 වර්ෂයේ දී රටට පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබීය.

8.2 ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කරලීම හා නියාමනය කිරීම.

8.2.1 ඇගයීම් නිලධාරී සංචිතය පවත්වා ගෙන යාම.

8.2.1.1 අවශ්‍ය වන ඇගයීම් නිලධාරී ප්‍රමාණය පුරෝකථනය කිරීම.

සංවර්ධනය කර ඇති ජාතික නිපුණතා සම්මත හා 2017 වර්ෂයේ අවසන් වන විටදී සංචිතයේ ලියාපදිංචි වී සිටි ඇගයීම් නිලධාරි/ නිලධාරිනියන් සංඛ්‍යාවත්, එම නිලධාරීන්ගේ භූගෝලීය පැතිරීමත්, යන කරුණු සැලකිල්ලට ගෙන අවශ්‍යවන ඇගයීම්කරුවන් සංඛ්‍යාව පිළිබඳ පුරෝකථන වාර්තාව සකස්කරන ලදී.

8.2.1.2 නිපුණතා පාදක ඇගයීම් නිලධාරී / නිලධාරිනියන් ලෙස පුහුණුකිරීම සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

නිපුණතා පාදක ඇගයීම් නිලධාරි/නිලධාරිනියන් ලෙස පත්වීම සඳහා පෞද්ගලික අංශයෙන්ද ඉල්ලුම් කළ යුතුයි. මෙහිදී අයදුම්පත් කැඳවීම සඳහා නිශ්චිත කාල වකවානුවක් නොමැති අතර, ලැබෙන අයදුම්පත් අතරින් සුදුස්සන් තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයන් මඟින් සිදු වේ.

අදාල වෘත්තීන් පිළිබඳව විශේෂඥ දැනුමින් යුත් පුද්ගලයන් මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පත්කරන අතර, එවැනි සම්මුඛ පරීක්ෂණ දින 12ක් 2018 වසර තුළ පැවැත්වීමට සැලසුම් කර සිටි නමුදු ඉල්ලුම හා අවශ්‍යතාවයන්ට අනුව එවැනි දින 19ක් ගත වූ වසර තුළ පවත්වා ඇත.

8.2.1.3 ඇගයීම් නිලධාරී පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වීම හා එයට පහසුකම් සැපයීම.

මේ යටතේ අදාල පුහුණුකිරීමේ වැඩසටහන් 10ක් පවත්වන ලදී.

8.21.4 ඇගයීම්කරුවන් වෙත බලපත්‍ර ලබාදීම

අදාල ලිඛිත විභාගයකින් අනතුරුව එම විභාගය සමත්වන්නන් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයට අනුව අදාල ඇගයීම් නිලධාරි/නිලධාරිනියන්ට බලපත්‍ර ලබාදීමට කටයුතු කෙරේ. අදාල ලිඛිත විභාගය 2018 වසරේදී කිරීමට සැලසුම් කර තිබූ අතර මෙම ලිඛිත විභාගය සඳහා අයදුම්කරුවන් 320 වෙත අයදුම්පත් යවනලද නමුත් 136 දෙනෙකු පමණක් මේ සඳහා සහභාගීවන ලදී. අදාල බලපත් 2019 වසරේදී ලබාදීමට කටයුතු කරනු ඇත. වලංගුතාවය අවසන් වූ බලපත්‍ර අළුත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම්කර ඇත.

8.2.2. නිපුණතා පාදක ඇගයීම් කටයුතු නිගමනය කිරීම

මෙය යටතේ කාර්යයන් 03ක් පහත සඳහන් පරිදි සිදු කරන ලදී.

- පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.
- රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල/ආයතනවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

8.2.2.1 පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල නිපුණතා පාදක ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීම

තෘතීයක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල/ මධ්‍යස්ථානවල ප්‍රතිපාදනය කර ඇති පාඨමාලා අවසානයේ එම පාඨමාලා හදාරනු තිබූ ආධුනික/ ආධුනිකාවන් ඇගයීමට ලක්කොට නිපුණතාවය ලබාඇති ආධුනික/ ආධුනිකාවන් හට ජාතික වෘත්තීය සුදුසුකම් පිරිනැමේ.

එහිදී අදාල නිර්නායක පරීක්ෂාකොට ඒවා සපුරන ලද අවස්ථාවන්හී දී කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඇගයීම් සංචිතයේ සිටින ඇගයීම්කරුවන් පත්කොට ඔවුන්ලවා ඇගයීම් කටයුතු සංවිධානය කලයුතුය. විවිධ පුහුණු මධ්‍යස්ථාන/ ආයතන විසින් 2018 වසර තුළ ඇගයීම් සඳහා කෙරුණා ඉල්ලීම් ප්‍රමාණය 838කි. 2017 වසරේ ඉලක්කය 550 වුවද එම ඉලක්කය ඉක්ම වූ මෙම ඉල්ලීම් ප්‍රමාණයට හේතුව වූයේ පෞද්ගලික අංශය තුළ මෙම ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය බෙහෙවින් ජනප්‍රිය තත්ත්වයකට පත්ව තිබීමය. ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 වන මට්ටම අ.පො.ස. (සා.පෙ.) මට්ටමටත් 4 වන මට්ටම අ.පො.ස. (උ.පෙ.) මට්ටමටත් සමාන කිරීම ද මෙම ව්‍යාප්තියට හේතු වන්නට පුලුවන.

8.2.2.2 රාජ්‍ය අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල ඇගයීම් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දීම.

රාජ්‍ය අංශයට අයත් පුහුණු ආයතනවල පැවැත්වෙන පුහුණු පාඨමාලාවල ඇගයීම් පැවැත්වීම සඳහාද අනුමැතිය ලබාදීමේ කාර්යය කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ සහ ඇගයීම් අංශය විසින් ඉටු කරන ලදි.

එවැනි අනුමත ලබාදීම් ගත වූ වසර තුළ 1502ක් ඉටුකරන ලද අතර, එම ඉල්ලීම් ඉදිරිපත් වූයේ යොවන කටයුතු හා නිපුණතා අමාත්‍යාංශයට අයත් මෙන්ම ඊට පරිබාහිරව ක්‍රියත්මක රාජ්‍ය අංශයට අයත් පහත සඳහන් පුහුණු මධ්‍යස්ථාන/ ආයතනවලිනි.

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශයට අයත් ආයතන / පුහුණු මධ්‍යස්ථානයන්.

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
- සාගර විශ්ව විද්‍යාලය
- ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශයට අයත් නොවන රාජ්‍ය ආයතයන.

- ජාතික තරුණ සේවා සභාව
- ශ්‍රී ලංකා යොවුන් බලකාය
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- සමාජ සේවා දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- ශ්‍රී ලංකා නාවුක හමුදාව

කෙසේ වෙතත් රාජ්‍ය ආයතන/ පුහුණු මධ්‍යස්ථාන තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් පිරිනැමීම සඳහා වන ඇගයීම් සඳහා 2018 වසර තුළ ඉහළ ඉල්ලුමක් පැවතිබවක් දක්නට ඇති අතර, එය ඉලක්ක කළ ප්‍රමාණයට වඩා ඉහළයාමක් වේ. මෙවැනි අනුමත කිරීම් 2500ක් ගත වූ වසරේ ඉලක්කය වූ අතර, සත්‍ය ලෙසම එවැනි ඉල්ලීම් 2597ක් ගත වූ වසර තුළ ලබා දී ඇත.

මෙසේ වීමට පහත සඳහන් කරුණු හේතුවන්නට ඇතැයි අනුමාන කළ හැක.

- විදේශ රැකියා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම පිළි ගැනීම.
- රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය විසින් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු ආයතන සඳහා පුද්ගලයින් බඳවා ගැනීමේදී හා උසස්වීම් ලබාදීමේ දී ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය භාවිත කරන ලෙස අදාල ආයතන වෙත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් දැනුම් දීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රම ක්‍රමයෙන් සමාජය තුළ ප්‍රචලිත වීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 අ.පො.ස. (සා.පෙ.)මට්ටමටත් 4 වන මට්ටම අ.පො.ස. (උ.පෙ.) මට්ටමටත් සමාන කිරීම.

නිපුණතා පාදක පුහුණු පාඨමාලා තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමට අමතරව තවත් එක් ක්‍රමයකට එම සුදුසුකම් ලබාදේ. එනම්, කර්මාන්තය තුළ වෘත්තීන්හි නියැලි අත්දැකීම් ලබා ඇති පුද්ගලයන්ට පාඨමාලා හැදෑරීමට අපහසු නිසා NVQ සුදුසුකම සඳහා ඉල්ලුම් කළහැකි අතර, එවැනි අත්දැකීම් ලබාඇති පුද්ගලයන්ගේ නිපුණතා ඇගයීමිකර NVQ සහතිකය ලබා දේ. එම ක්‍රමය පෙරදැනුම ඇගයීමේ ක්‍රමය (RPL) ලෙස හැඳින්වේ. එම ක්‍රමය තුළින් ජාතික වෘත්තීය සුදුසුකම ලබා දීමට පහත සඳහන් රාජ්‍ය ආයතන 3කට බලය පවරා ඇත.

එම ආයතන 03 වන්නේ,

- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

8.2.7. පෙර දැනුම් ඇගයීමේ ක්‍රමය පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවතීම.

වරින්වර ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලද අතර, මෙහෙයුම් කම්‌ටු රැස්වීම්වලදී ද විභාග මණ්ඩල රැස්වීම්වලදී ද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය සහ වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ පෙර දැනුම ඇගයීම ක්‍රමය පිළිබඳ ගැටළු හා අභියෝග පිළිබඳව සාකච්ඡා කරන ලදී. ඊට අමතරව විදේශ සේවානියුක්ති කාර්යංශයේ නිලධාරීන් සමඟ රැස්වීම්වාරයක් පවත්වන ලදි. එම කාර්යංශය තුළින් "ගෘහස්ථ ගෘහ පාලිකා" තනතුර සඳහා සහ සාත්තු සහායක රැකියා සඳහා විදේශ ගතවන්නන්හට විශේෂ පුහුණු පාඨමාලා දිවයිනපුරා පිහිටි එම කාර්යංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වේ. එම පාඨමාලා පෙර දැනුම ඇගයීම ක්‍රමය අනුව අවසාන ඇගයීම් පවත්වා ඔවුන්හට ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදේ.

8.3. නිපුණතා පාදක ඇගයීම්වල සංඝතභාවය තහවුරු කිරීම.

8.3.1. සංඝතභාවය තහවුරු කිරීමේ හා ඇගයීම්කරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩමුළු පැවැත්වීම.

ඉහත සඳහන් කරන ලද අභිමතාර්ථය සපුරාගැනිමේ අරමුණින් වැඩ මුළු 4 ක් වසර තුල පැවැත්වීමට සැලසුම් කරන ලදී. මෙම නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය ආරම්භ කරන ලද්දේ 2005 වසරේ දී වන අතර ඒ පිළිබඳව ඇගයීම්කරුවන් පුහුණුකිරීම අරඹා ඇත්තේද එම වසරේදීමය. එම වැඩමුළුවල දී ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව සහ නව ක්ෂේත්‍ර දැනුම යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත.

8.3.2. රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වෙන නිපුණතා පාදක ඇගයීම් කටයුතු අධීක්ෂණය කිරීම.

ගත වූ වසර තුල රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතනවල පවත්වන ලද නිපුණතා පාදක ඇගයීම් 550 ක් අධීක්ෂණය කරන ලදි. 2018 වර්ෂයේ රාජ්‍ය අංශයේ නිපුණතා පාදක ඇගයීම් 288 ක් සඳහා ඉල්ලීම් ලද අතර එය ඉටු කරන ලදී. එම අධීක්ෂණ ප්‍රතිඵල අනුව NVQ චක්‍රලේඛණ අංක 2017/1 අනුව සහ ඉහල කළමණාකාරිත්වයේ උපදෙස් මත ඇගයීම් ඇගයීම් ක්‍රියාවලියට හා මූලධර්මවලට පටහැනිව කටයුතු කළ අවස්ථාවලදී ඇගයීම්කරුවන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම හා අනෙකුත් අදාල විනයානුකූල තීරණ ගන්නා ලදී.

8.4 පැමිණිලි විභාග කිරීම.

ගත වූ වසර තුල ඇගයීම් පිළිබඳ ලැබූ ලිඛිත පැමිණිලි 01 ක් විභාග කිරීම සඳහා නීති නිළධාරිනිය වෙත යොමු කරන ලදී.

8.5. පොදු ලිඛිත විභාගය පැවැත්වීම.

8.5.1. ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 හා 4 ප්‍රදානය කිරීම සඳහා පොදු ලිඛිත විභාගය පැවැත්වීම.

(රූපලාවන්‍ය, කේෂාලංකරණ, පෙර පාසල් ගුරු සැලසුම් ශිල්පී, විදුලි ශිල්පී, මෝටර්රථ කාර්මිකශිල්පී සහ ශීතකරණ හා වායුසමීකරණ කාර්මිකශිල්පී යන වෘත්තීය ක්ෂේත්‍රයන්හි අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීමේ ලිඛිත විභාගය පහත විස්තර කෙරෙන ආකාරයට පවත්වන ලදී.

ක්ෂේත්‍රය	ජනවාරි	ජූලි
රූපලාවන්‍ය	1743	2432
කේෂාලංකරණ	1617	2003
පෙර පාසල් ගුරු	-	130
සැලසුම් ශිල්පී	-	255
විදුලි ශිල්පී	-	2018 ජනවාරි මස පවත්වන ලදී
මෝටර් රථ කාර්මික ශිල්පී	-	
ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පී	-	

2018 වසරේ දී අන්තර්ජාල ක්‍රමයට ප්‍රශ්න සංචිත සංවර්ධනය කිරීම සඳහා පාඨමාලා 13ක් තොරාගෙන ඒ සඳහා අදාල කටයුතු ආරම්භකල අතර 2019 වසරේ මැදභාගය වනවිට අවසන් කිරීමට කටයුතු කරනු ඇත.

ඉහත සඳහන් වන පාඨමාලාවල ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 3 හා 4 සඳහා ලිඛිත පරීක්ෂණය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2017 ජනවාරි සහ ජූලි මාසවල පවත්වන ලදී. එසේම RPL අයදුම්කරුවන් සඳහා 2018 ඔක්තෝබර් මස පොදු විභාගයක් පවත්වන ලදී. මෙම සියලුම පරීක්ෂණවල ප්‍රතිඵල එම වර්ෂය තුලදීම නිකුත්කරන ලදී.

8.5.2. ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 ලිඛිත විභාගයන් පැවැත්වීම

ගත වූ වසර තුල අයදුම්පත් කැඳවා ICT, Quantity Surveying, Construction Technology, Cosmetology, Agriculture Production Technology, Mecatronic Technology, Ref & AC Technology යන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 පාඨමාලාවල පොදු ලිඛිත විභාගය 2018 වසර තුල අදාල ආයතනවල ඉල්ලීම මත පවත්වන ලදී.



8.6 ඇගයීම් නිලධාරීන් සඳහා ගෙවීම් කිරීම.

කේන්ද්‍රීය අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මකවන පහත සඳහන් ආයතනයන්හි පවත්වන ලද ඇගයීම් සඳහා සහභාගි වූ ඇගයීම්කරුවන්ට දීමනා හා ගමන් ගාස්තු කොමිෂන් සභාවේ ඇගයීම් ඒකකය විසින් ගෙවීමට කටයුතු කරන ලදී.

1. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
2. ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය (නිපුණතා පාදක පාඨමාලා සඳහා)
3. ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (නිපුණතා පාදක සහ ආයතන ගත පුහුණු පාඨමාලා සඳහා)

මෙම ශීර්ෂය යටතේ ඇගයීම් නිලධාරීන්ගේ වවුචර්පත් 4987 ක දීමනා ඇගයීම් ඒකකය විසින් සහතික කොට ගිණුම් අංශයට ඉදිරිපත් කරනලදී. එම වවුචර්පත්වල මුළු වටිනාකම 23,500,000 ක් විය. මේ අනුව සියලු හිඟනිබූ ගෙවීම් 2018 වර්ෂය තුලදී ගෙවා අවසන් කරන ලදී.

8.7. ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නිකුත් කිරීම

8.7.1. ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් නිකුත් කිරීම

2017 වසර තුළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහතිකපත් 65212 ක් නිකුත් කර ඇති අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගුව 8.7.1 2018 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් ලාභීන් (ආයතන අනුව)

ආයතනය	සහතිකපත් ලාභීන්			සහතිකපත් ප්‍රමාණය		
	නිපුණතා පදනම් ඇගයීම් ප්‍රදාන ලාභීන්	පෙර දැනුම් ඇගයීම් ප්‍රදාන ලාභීන්	මුළු සහතික ලාභීන්	නිපුණතා පදනම් ඇගයීම් මඟින් නිකුත්කල සහතික	පෙර දැනුම් ඇගයීම් අනුව නිකුත්කල සහතික	මුළු සහතික ප්‍රමාණය
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	7,834	93	7,927	8,724	94	8,818
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	2,414	5,092	7,506	2,675	5,751	8,426
වෘත්තීය පුහුණු අධිකාරිය	15,850	1,220	17,062	19,217	1,593	20,810
ජාතික තරුණසේවා සභාව	1,511	0	1,511	1,780	0	1,780
පෞද්ගලික අංශය	14,439	0	14,439	15,986	0	15,986
එකතුව	**42,048**	**6,405**	**48,453**	**48,382**	**7,438**	**55,820**

මූලාශ්‍රය - තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

NVQ 1 සිට NVQ 6 දක්වා මට්ටම් වලට 2018 වර්ෂය තුලදී නිකුත් කර ඇති සහතිකපත් ප්‍රමාණයන් ඒ ඒ ආයතන අනුව අංක 8.7.2 හි දැක්වේ.

ආයතනය	Level 1	Level 2	Level 3	Level 4	Level 5	Level 6	මුළු සහතික ප්‍රමාණය
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	56	2,498	6,553	4,648	0	0	13,755
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	15	488	3,293	4,215	789	18	8,818
ජාතික තරුණසේවා සභාව	2	220	547	1,011	0	0	1,780
වෘත්තීය පුහුණු අධිකාරිය	633	1,666	10,981	7,223	307	0	20,810
පෞද්ගලික අංශය	417	989	10,466	3,324	295	496	15,987
එකතුව	**1,123**	**5,861**	**31,840**	**20,421**	**1,391**	**514**	**61,150**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2018 වර්ෂයේ දී පුහුණු ආයතන විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතික (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව) වගුව 8.7.3 හි දැක්වේ.

වගුව 8.7.3 2018 වර්ෂය සඳහා නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත්‍ර ප්‍රමාණය (ස්ත්‍රී / පුරුෂ භාවය අනුව)

ආයතනය	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව	5,964	2,854	8,818
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය	10,206	3,549	13,755
වෘත්තීය පුහුණු අධිකාරිය	12,850	7,960	20,810
ජාතික තරුණ සේවා සභාව	440	1,340	1,780
පෞද්ගලික අංශය	7,629	8,358	15,987
එකතුව	**37,089**	**24,061**	**61,150**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2018 වසර තුල සහතික පත් 1095 ක් නැවත මුද්‍රණය කරන ලදී. ඒ පිළිබඳ විස්තර වගු අංක 8.7.4 දැක්වේ.

වගුව 8.7.4 නැවත මුද්‍රණය කරන ලද සහතිකපත්‍ර පිළිබඳ විස්තර - 2018

සහතික වර්ගය	සහතික පත්‍ර ප්‍රමාණය
මුද්‍රණ දෝෂ හේතු කොටගෙන නැවත මුද්‍රණය කරන ලද සහතිකපත්‍ර	905
අස්ථානගත වූ සහතික වෙනුවට අනු පිටපත් මුද්‍රණය	11
එකතුව	916

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

පහත වගු අංක 8.7.5 මගින් 2018 වර්ෂයේ නිකුත්කල NVQ සහතික පෙර වර්ෂය 2017 සමඟ සැසඳීමක් දැක්වේ.

වගුව 8.7.5 2016 හා 2017 වර්ෂ වලදී නිකුත් කල ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ප්‍රමාණය අතර සංසන්දනයක් (පෙර දැනුම ඇගයුම හා නිපුණතා පාදක ඇගයීම මගින්)

සහතික වර්ගය	2017	2018	වර්ධනය (සහතිකපත් ප්‍රමාණය)	වර්ධනය ප්‍රතිශතයක් ලෙස %
නිපුණතා පාදක ඇගයීම් ක්‍රමය	57,103	48,382	(-8721)	-
පෙර දැනුම ඇගයීම් ක්‍රමය	7,277	7,438	161	1.16

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

2006 වර්ෂයේ සිට නිකුත් කරන ලද සහතික පිළිබඳ විස්තර වගු අංක 8.7.6 හි දැක්වේ.

වගුව 8.7.6 2006 සිට 2017 දක්වා නිකුත් කරනලද මුළු සහතික පත්‍ර ප්‍රමාණය

වර්ෂය	සහතිකපත්‍ර සංඛ්‍යාව
2006	259
2007	1,629
2008	8,915
2009	11,249
2010	13,256
2011	16,572

වර්ෂය	සහතිකපත්‍ර සංඛ්‍යාව
2012	18,111
2013	22,855
2014	28,546
2015	44,148
2016	47,017
2017	65,212
2018	61,150
එකතුව	**338,919**

මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

ප්‍රස්තාරය 8.7.1 2006 සිට 2018 දක්වා නිකුත්කල සහතිකපත්‍ර



මූලාශ්‍රය - තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ දත්ත සංචිතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ආරම්භයේ සිට 2018 වර්ෂය අවසාන වන විට සහතිකපත් 338,919 ක් නිකුත්කර ඇත

.

9.0 මහජන සම්බන්ධතා (වෘත්තික හා කර්මාන්ත) අංශය

9.1 පසුබිම

කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍යකරන නිපුණතාවයෙන් හෙබි පුද්ගලන් බිහිකිරීම වෘත්තීය අධ්‍යාපන හා කාර්මික ක්ෂේත්‍රයේ මූලික පරමාර්ථය වන අතර කාලීනව සිදුවන කර්මාන්තයේ අවශ්‍යතාවන්ට අනුකූලව වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය යාවත්කාලීන කිරීම රටක ආර්ථික තත්ත්වය වෙනස් කිරීම සඳහා ඍජුව බලපායි. කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට අනුකූල නිපුණතාවයෙන් හෙබි තරුණ පරපුරක් බිහිකිරීම උදෙසාත් කර්මාන්තයේ හා කාර්මික අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍ර අතර මනා සම්බන්ධතාවයක් ගොඩ නැගීම සඳහාත් ඒ තුළින් මාර්ගෝපදේශන සේවාව වඩාත් ශක්තිමත් කිරීමේ අපේක්ෂාව ඇතිව 2016 වර්ෂයේ කර්මාන්ත සබඳතා අංශය පිහිටුවනු ලැබිය.

ඒ අනුව 2018 වර්ෂයේදී කර්මාන්ත සබඳතා අංශය වඩාත් ශක්තිමත්ව අවශ්‍ය සම්බන්ධතාවයන් වර්ධනය කිරීමේ කාර්යයෙහි නියැලෙන අතරම ඊට සමගාමීව බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රය නවමු මාවතකට ගෙන ඒම උදෙසා සේවාවන් රැසක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එහි දී ආංශික නිපුණතා සභා 4ක් ශක්තිමත් කිරීම තුළින් සහ ප්‍රාදේශීයව ක්‍රියාත්මක වාණිජ මණ්ඩල සමඟ සම්බන්ධතාවය ශක්තිමත් කිරීම මගින් කර්මාන්තයේ හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමට හැකියාව පැවතුන බව කිව හැකිය.

2016 වර්ෂයේ ආරම්භ වූ කර්මාන්ත සබඳතා අංශය 2018 වර්ෂය අවසාන භාගය වන විට වඩාත් පුළුල්ව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවක් පැන නැගුණු අතර එම කාර්ය වඩාත් සාර්ථකව ඉටු කර ගැනීම සඳහා මහජන සම්බන්ධතා (වෘත්තික හා කර්මාන්ත) අංශය යන නමින් මේ වන විට එහි කාර්යභාරය ඉටු කරමින් පවතී.

9.2 මහජන සබඳතා (වෘත්තික හා කර්මාන්ත) අංශයේ අරමුණු

කර්මාන්තයට අවශ්‍ය කෙරෙන නිපුණතාවයන්ගෙන් හෙබි මානව ශ්‍රමය සැපයීමට හැකි කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයක් ඇති කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය මහජන සම්බන්ධතා (වෘත්තික හා කර්මාන්ත) අංශයේ ප්‍රධාන අරමුණ ලෙස හැඳින්විය හැකිය. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් වන උප අරමුණු ක්‍රියාවට නැංවීම මහජන සම්බන්ධතා අංශයේ ප්‍රධාන වගකීම වේ.

- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු කිරීම සඳහා භාවිත වන නිපුණතා සම්මත හා පුහුණු පාඨමාලා සංවර්ධනය සඳහා කර්මාන්තයේ දායකත්වය ලබා ගැනීම.
- කර්මාන්තයේ සිදුවන තාක්ෂණික වෙනස්කම් හා නව ප්‍රවණතාවයන් පිළිබඳව කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු කිරීම් කටයුතුවල නියැලෙන අධ්‍යයන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා ඒ සම්බන්ධව පුහුණුවීම් අවශ්‍ය වෙතොත් ලබා දීම.
- දැනට ලබාදෙනු ලබන වෘත්තීය පුහුණුවත් කර්මාන්තයේ ඉල්ලුමත් අතර නිපුණතා පරතරයක් ඇතිදැයි විමසා බලා ඊට අවශ්‍ය නිගමන හා නිවැරදි කිරීම් ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණුව ලබන ආධුනික ආධුනිකාවන් උදෙසා කර්මාන්ත ආශ්‍රිත පුහුණුව ලබා දීම පිළිබඳ පසුවිපරම් කිරීම හා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකිරීම.
- කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණුව අවසන් කරන ආධුනික ආධුනිකාවන් කර්මාන්තයේ පවතින රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කොට ඔවුන් හට රැකියා සොයා ගැනීමට සහය දැක්වීම.

- විධිමත් පුහුණුවකින් තොර කර්මාන්තයේ නියුතු ශිල්පීන් හට සුදුසුකම් සහතික ලබා දීම සඳහා කර්මාන්ත ආංශික නිපුණතා සභාවන්හි සහයෝගය සහිතව ඔවුන් දැනුවත් කිරීම හා වෘත්තීය ගමන් මඟේ ඉහළට යාම සඳහා ඔවුන් සූදානම් කිරීම.
- කර්මාන්තයන් හා ඒවායෙහි රැකියා පිළිබඳව සමාජයේ සුභවාදී ප්‍රතිරූපයක් ඇති කිරීම.
- කොමිෂන් සභාවේ සේවාවන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- පාසල් හැර යන සිසු සිසුවියන් සඳහා කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව පිළිබඳව දැනුවත් කොට ඔවුන් මෙම කාර්මික පුහුණු ක්ෂේත්‍රය වෙත ආකර්ෂණය කර ගැනීම.
- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය පිළිබඳ සමස්ථ ප්‍රජාව දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- පොදු වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර අනුගමනය කිරීම.
- විවිධ වෘත්තික කණ්ඩායම්, වෘත්තිකයන් හා සම්බන්ධතාවය වැඩිදියුණු කරගනිමින් කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

9.3 කාර්යභාරය

ඉහත දක්වන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මහජන සම්බන්ධතා අංශය මඟින් පහත කාර්යයන් 2018 වර්ෂය තුළදී ඉටුකර ඇත.

9.3.1 ආංශික නිපුණතා සහා 4ක් පවත්වාගෙන යාම වෙනුවෙන් ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් ලබාදෙන ප්‍රතිපාදන ආංශික නිපුණතා සහා වෙත අත්තිකාරම් ලෙස ලබාදීම වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

9.3.1.1 ඉදිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

9.3.1.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

9.3.1.3 නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාව.

9.3.1.4 සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

9.3.2 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය ඉහළ නැංවීමට අදාලව සිදුකරනු ලබන සංවර්ධන කටයුතු වෙනුවෙන් ආංශික නිපුණතා සභා සඳහා මුදල් ලබා දීම හා මඟපෙන්වීම ඉටුකිරීම.

9.3.3 ආංශික නිපුණතා සභාවන්හි ප්‍රගති සමාලෝචනය හා ඉදිරි කටයුතු පැහැදිලි කිරීම සඳහා සභාපතිවරුන් සමඟ රැස්වීම් පැවැත්වීම.

9.3.4 දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානයන්හි සේවාව ඇගයීම් සිදුකිරීම.

9.3.5 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව සංවර්ධන මානයන් පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම හා පවත්නා රැකියා අවස්ථාවන් පිළිබඳව මහජනතාව, පාසල් සිසුන්, පාසල් හැරගිය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු කිරීම.

9.3.6 සේවාලාභීන්ගේ දැනුවත් වීම උදෙසා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් කෙරෙන කාර්යයන් පිළිබඳව තොරතුරු සංග්‍රහයක් සකස් කිරීම.

9.3.7 අමාත්‍යාංශ යටතේ පවත්නා පුහුණු ආයතන හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳව නිලධාරීන්, මහජනතාව, පාසල් සිසුන්, දෙමාපියන් දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා සකස් කිරීම.

9.3.8 ජනමාධ්‍ය සමඟ සම්බන්ධව වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රචාරය කිරීම හා තොරතුරු බෙදා හැරීම.

9.3.9 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පවතින්නාවූ අවස්ථාවන් පිළිබඳව තෝරාගත් කණ්ඩායම් සඳහා සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් දැනුවත් කිරීම.

9.3.10 වෘත්තීය මාර්ගෝපදේශනය හා මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳ විශේෂ වැඩසටහන් පැවැත්වීම.

9.3.11 ආංශික නිපුණතා සහාවලින් ආවරණය නොවන ක්ෂේත්‍රයන් සඳහා පළාත් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම.

9.3.12 ආංශික නිපුණතා සභාව, වාණිජ හා කර්මාන්ත මණ්ඩලය මෙන්ම දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ඒකාබද්ධව ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම.

9.3.13 ප්‍රතිපත්ති සංවර්ධනය උදෙසා ජාතික වෘත්තීය මාර්ගෝපදේශන නියාමන කමිටුවක් ක්‍රියාත්මක කිරීම.

9.3.14 පොදු වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සංවර්ධනය හා වැඩිදියුණු කිරීමට දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානවලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.

9.3.15 කර්මාන්තගත පුහුණුව විධිමත්ව සිදුකිරීම පිළිබඳ සංවාද සහ ඇගයීම් අනුව නිර්දේශ ඉදිරිපත් කිරීම.

9.3.16 නිපුණතා සංවර්ධන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා කුසලතා වර්ධන වැඩසටහන් පැවැත්වීම.

9.3.17 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳ වාර්තාමය වැඩසටහනක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

9:3:1 ආංශික නිපුණතා සභා 4ක් පවත්වාගෙන යාම වෙනුවෙන් ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන මඟින් ලබාදෙන ප්‍රතිපාදන ආංශික නිපුණතා සභා වෙත අත්තිකාරම් ලෙස ලබාදීම වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

මහජන සම්බන්ධතා අංශයේ දායකත්වය අනුව ආංශික නිපුණතා සභා 4ක් 2018 වර්ෂයේ සිට ක්‍රියාකාරීව පැවති අතර අකර්මණ්‍යව තිබූ සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාවද 2018 මැයි මාසයේ සිට ක්‍රියාත්මක විය. ඒ අනුව පහත සඳහන් අයුරින් ආංශික නිපුණතා සභා 4ක් 2018 වර්ෂයේ සක්‍රීයව ක්‍රියාකාරී මට්ටමේ පැවතිනි.

1. ඉදිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සභාව
2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාව
3. නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාව
4. සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව

මෙම ආංශික නිපුණතා සහා පවත්වාගෙන යාමට අවශ්‍ය පරිපාලන වියදම් තෙමාසිකව මහජන සම්බන්ධතා අංශයෙන් නිකුත් කරන ලද අතර ආංශික නිපුණතා සභාවලින් අදාල අත්තිකාරම් පියවා ඇත.

මෙයට අමතරව සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව මඟින් එම සභාව පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික කාර්යාලීය උපකරණ ලබා ගන්නා ලදී.

එමෙන්ම මෙම ආංශික නිපුණතා සභාවලින් විවිධ සංවර්ධන කටයුතු රාශියක් 2018 වර්ෂය තුළදී ඉටුකරන ලද අතර එකී කාර්යයන් පහත අයුරින් වේ.

9.3.1.1 ඉඳිකිරීම් කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

- ඉඳිකිරීම් ක්ෂේත්‍රයට අදාල පුහුණු උපදේශකයන් සඳහා ක්ෂේත්‍රයේ නව තාක්ෂණ සොයාගැනීම් හා යොදාගැනීම් පිළිබඳව පුහුණු උපදේශකයන් පුහුණු කිරීම.
- ඉඳිකිරීම් ක්ෂේත්‍රයට අදාල ජාතික වෘත්තීය සුදුසුකම් 03/04 මට්ටම් සඳහා ඇගයුම්කරුවන්ගේ සංචිතය වැඩි කිරීම සඳහා දායකත්වය සැපයීම.
- ඉඳිකිරීම් ක්ෂේත්‍රයේ පුහුණු උපදේශකවරුන් හට අලුතින් හඳුන්වා දුන් ජාතික වෘත්තීය සුදුසුකම් 03 මට්ටම හා ජාතික වෘත්තීය සුදුසුකම් 04 මට්ටමේ පාඨමාලා වෙනුවෙන් ඉගැන්වීම් ක්‍රමවේදය උසස් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.
- පෙර දැනුම ඇගයීම් ක්‍රියාවලිය තුළින් NVQ ලබාගැනීමට යොමුකල ඉඳිකිරීම් ක්ෂේත්‍රයට අදාල අයදුම්කරුවන් හට ඔවුන්ගේ දැනුම් පරතරය පියවීම සඳහා අවශ්‍ය වැඩමුළු සංවිධානය කිරීම.
- ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය සමඟ එක්ව ඉඳිකිරීම් ක්ෂේත්‍ර 04ක් සඳහා එනම්, ඉඳිකිරීම් ශිල්පී, ප්ලනල ශිල්පී, කම්බි නැවුම්කරු, සැලසුම්කරු යන වෘත්තීන් සඳහා විෂය මාලා සංවර්ධනයට පියවර ගැනීම.
- ලෝක කුසලතා දිනය සැමරීමට සමගාමීව ඉඳිකිරීම් ක්ෂේත්‍රය තුළ පරිසර හිතකාමී ඉඳිකිරීම් සම්බන්ධව මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තාක්ෂණ විදුහල්වල තෝරාගත් ඩිප්ලෝමා පාඨමාලාවක ඉගැනුම් ක්‍රියාවලිය ඇගයීමේ ක්‍රමවේද පිළිබඳ ප්‍රගතිය කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය තුළින් ඉදිරිපත් කිරීම.

9.3.1.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාව.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත ආංශික නිපුණතා සභාවෙහි දායකත්වයෙන් සකස් කරන ලද විෂය මාලා පිළිබඳව උපදේශකවරුන් පුහුණු කිරීමේ වැඩමුළු කිහිපයක් 2018 වර්ෂය පුරාවට පවත්වන්නට යෙදුනි. එහිදී එම පාඨමාලා ක්‍රියාත්මක කිරීමට අදාලව පහසුකම් පවත්නා මධ්‍යස්ථාන පිළිබඳව අවධානය යොමුකල අතර එම මධ්‍යස්ථානවල උපදේශකවරුන් පළමු අදියර යටතේ පුහුණු කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මෙන්ම ජාතික තරුණ සේවා සභාව නියෝජනය කරමින් උපදේශකවරුන් සඳහා පහත විෂය මාලා පිළිබඳව පුහුණු පාඨමාලා පවත්වන ලදී.

a. Associate Software Developer

b. Associate Creative Designer

c. IT support

- **ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති ප්‍රකාශයක් සංවර්ධනය කිරීම.**

  මෙම ආංශික නිපුණතා සභාවෙහි විවිධ කර්මාන්තායතන නියෝජනය වන අතර මෙම සියලු කර්මාන්තයන් එකම අරමුණක් ඔස්සේ ගමන් කළ යුතු වන නිසා ඒ පිළිබඳ ප්‍රතිපත්ති මාලාවක් සංවර්ධනය කිරීම 2018 වර්ෂයේ සිදුකරන ලදී.

- **තොරතුරු තාක්ෂණ කර්මාන්තය සඳහා සම්පත්දායක සංචිතයක් හඳුනා ගැනීම.**

  තොරතුරු සන්නිවේදන තාක්ෂණයට අදාලව පුහුණුවීම් සිදුකිරීම, ප්‍රතිපත්ති සකස් කිරීම මෙන්ම විෂය මාලා වැඩිදියුණු කිරීම සඳහා සම්පත්දායක සංචිතයක් හඳුනාගැනීම මෙම වර්ෂයේදී සිදුවිය.

- **කර්මාන්තයේ පවත්නා අවශ්‍යතාවයන්ට අනුව සංවර්ධනය විය යුතු අංශ හඳුනා ගැනීම.**

  කර්මාන්තයේ පවත්නා විවිධ අවස්ථාවන්ට අනුකූලව සංවර්ධනය විය යුතු අංශයන් හඳුනා ගැනීම හා එම අංශයන්ගේ ප්‍රගතිය විශ්ලේෂණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අනු කමිටු සංවර්ධනය කර එම අනුකමිටු භාර ප්‍රධානියෙකු නම්කර වගකීම පවරන ලදී. එවන් අනුකමිටු 12ක් 2018 වර්ෂයේ පැවැත්වුණි.

- **සිසුන් පුහුණු කිරීම.**

  NVQ 5 මට්ටමෙහි සිසුන් සඳහා කර්මාන්තගත පුහුණුවට හා කර්මාන්තයට ගැලපෙන මෘදු කුසලතා වර්ධනය පුහුණු කිරීම සඳහා ආංශික නිපුණතා සභාව මගින් යාපනය, අනුරාධපුර පුහුණු ආයතනවල වැඩමුළු පවත්වන ලදී.

- **අධ්‍යාපනික අංශවලට සම්බන්ධ නිලධාරීන් සඳහා වැඩමුළු පැවැත්වීම.**

  අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉල්ලීම මත අනාගත ලෝකයේ තොරතුරු තාක්ෂණය භාවිතය හා පාසල් පද්ධතිය තුළ තාක්ෂණ භාවිතය පිළිබඳව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ විදුහල්පතිවරුන් දැනුවත් කරන ලදී.

- **අන්තර්ජාතික සබඳතා පැවැත්වීම.**

  ඉස්ලාමාබාද් නිපුණතා සංවර්ධන කවුන්සිලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම 2018 වර්ෂයේ සිදුකළ අතර බංගලාදේශයේ පැවති ලෝක ආර්ථික සම්මේලනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආංශික නිපුණතා සභාවට ආරාධනා කරන ලදී.

- **E Citizen Progamme**

  නූතන තාක්ෂණය සියලුම පුරවැසියන්ට භාවිත කළ හැකි පරිදි වැඩිදියුණු කිරීම හා ඒ පිළිබඳව සරලව අවබෝධ කර ගැනීම සඳහා E Citizen නමින් වැඩසටහන් මාලාවක් විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීම සඳහා කැලණිය විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධව සංවර්ධනය කරන ලදී.

9.3.1.3 නිෂ්පාදන හා ඉංජිනේරු සේවා ආංශික නිපුණතා සභාව

සූර්ය බලශක්ති තාක්ෂණ ශිල්පී වෘත්තීය සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව එකතුව ජාතික නිපුණතා සම්මත වලංගු කිරීම.

1. සූර්ය බලශක්ති තාක්ෂණ ශිල්පී ජාතික වෘත්තීය සුදුසුකම් 4 සහ 3 මට්ටම
2. පොලිමර් තාක්ෂණ ශිල්පී
3. විදුලි ශිල්පී
4. පීඩක යන්ත්‍ර ශිල්පී
5. ඉඳිකිරීම් යන්ත්‍ර ශිල්පී
6. රථ වාහන පරීක්ෂණ ශිල්පී

ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීම

1. ප්‍රතිචක්‍රීකරණ සහයක
2. ඖෂධ ශිල්පී
3. නිෂ්පාදන සහායක

- පෑස්සුම්කරු පාඨමාලාවේ උපදේශකයින් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ දෙවන අදියර කටුබැද්ද IETI ආයතනයේදී ක්‍රියාත්මක කිරීම.
- ආංශික නිපුණතා සභාවේ අන්තර්ජාල පිටුව විවෘත කිරීම.
- වඩු උපදේශකවරුන් සඳහා නව තාක්ෂණික දැනුම ලබාදීමට වැඩමුළුවක් පැවැත්වීම.
- Artificial Inteligence පිළිබඳ කලමනාකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුව පැවැත්වීම.
- වැඩබිම සෞඛ්‍ය පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම.
- මෝටර් රථ ශිල්පී උපදේශකවරුන් හට පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.
- HR Gender Toolkit වලංගු කිරීම සඳහා වූ වැඩමුළුව සංවිධානය කිරීම.
- ක්ෂේත්‍ර ප්‍රවීනයන් සමඟ එක්ව තාක්ෂණ විද්‍යාලවල පවතින ඩිප්ලෝමා පාඨමාලා ඇගයීමට ලක් කිරීම.
  1. නිෂ්පාදන තාක්ෂණය, පස්වන මට්ටම - තාක්ෂණ විද්‍යාලය, මහනුවර
  2. මෝටර් වාහන තාක්ෂණය, පස්වන මට්ටම - තාක්ෂණ විද්‍යාලය, මරදාන
  3. ශීතකරණ හා වායු සමීකරණ ශිල්පී පාඨමාලාව, හතරවන මට්ටම - තාක්ෂණ විද්‍යාලය, අනුරාධපුර
  4. විදුලි තාක්ෂණය, පස්වන මට්ටම - තාක්ෂණ විද්‍යාලය, ගාල්ල
- මෝටර් වාහන තාක්ෂණ උපදේශකවරුන් හට පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.
- කර්මාන්ත හා ඉංජිනේරු සේවා අංශයේ කුසලතා පරතරය විශ්ලේෂණය සඳහා වූ එකඟතා සම්මුතියට එළඹීම.
- කාන්තා සේවා නියුක්තිය පිළිබඳ අදහස් ලබාගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- සංවර්ධන උපායමාර්ගික සැලසුම් කොළඹ හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක ඉලක්ක කර ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන සංවිධානය කිරීම.
- විදුලි ශිල්පීවරුන් සඳහා අත් පොත සකස් කිරීම වෙනුවෙන් වැඩසටහන් පැවැත්වීම.

9.3.1.4 සංචාරක කර්මාන්ත ආංශික නිපුණතා සභාව

- සංචාරක ක්ෂේත්‍රයේ පුහුණුකරුවන් ඇගයීම් ක්‍රියාවලිය ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හා එක්ව මහනුවර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම සැලසුම් කිරීම.
- පෙර දැනුම මගින් (RPL) අයදුම්කරුවන් 100ක් සඳහා හෝටල් හා සංචාරක ක්ෂේත්‍රයට අදාල ක්ෂේත්‍ර සඳහා ඇගයීම් කිරීමට සැලසුම් කිරීම.
- කුසලතා පරතර විශ්ලේෂණ ව්‍යාපෘතිය හෝටල් හා සංචාරක ක්ෂේත්‍රයට අදාලව සිදු කිරීමට අවශ්‍ය මූලික පියවර ගැනීම.
- හෝටල් ක්ෂේත්‍රයට අදාල විෂය මාලා සංවර්ධනයට ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය සමඟ සිදුකිරීමට එකඟ වීම.
- SLITM පාඨමාලා විෂය නිර්දේශය NVQ සම්මත සමඟ ගැලපීම් ක්‍රියාවලියට ප්‍රවිෂ්ඨ වීම.

9.3.2 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය ඉහළ නැංවීමට අදාලව සිදුකරනු ලබන සංවර්ධන කටයුතු වෙනුවෙන් ආංශික නිපුණතා සහා සඳහා මුදල් ලබා දීම හා මඟපෙන්වීම ඉටුකිරීම.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ආංශික නිපුණතා සහා විසින් සිදුකරනු ලබන සංවර්ධන කාර්යයන් සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනාවලීන් ඇගයීමට ලක්කරමින් එම යෝජනාවලීන්ගෙන් ක්‍රියාත්මක කළ හැකි හා ක්‍රියාකාරකම්වල අවශ්‍යතාවය අනුව ප්‍රතිපාදන ලබාදීම සඳහා මහජන සම්බන්ධතා අංශය ක්‍රියාකරනු ලබයි.

ඒ අනුව 2018 වර්ෂයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආංශික නිපුණතා සහාව සඳහා ප්‍රතිපාදන වෙන් කළ අතර එහි කටයුතු අවසන් කර පියවීම් සිදුකර ඇත.

9.3.3 ආංශික නිපුණතා සභාවන්හි ප්‍රගති සමාලෝචනය හා ඉදිරි කටයුතු පැහැදිලි කිරීම සඳහා සභාපතිවරුන් රැස්වීම් පැවැත්වීම.

ආංශික නිපුණතාවන්හි ප්‍රගති සමාලෝචනය හා ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදි ඇතිවන ගැටළු නිරාකරණය සඳහා මාසිකව සභාපතිවරුන්ගේ රැස්වීම් 7ක් 2018 වර්ෂයේදී පවත්වන්නට යෙදුණි.

එමෙන්ම තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආංශික නිපුණතා සභාවේ සාමාජික රැස්වීම් හා නිපුණතා සම්මතයන් පිළිබඳව වැඩසටහන් 2ක් පවත්වන්නට යෙදුනි.

9.3.4 දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානයන්හි සේවාව ඇගයීම් සිදුකිරීම.

දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන 27ක් දිවයින පුරා මේ වන විට ක්‍රියාත්මක කෙරෙන අතර එම මධ්‍යස්ථානවලින් සිදුකෙරෙන සේවාවන් ඇගයීම තුළින් නිලධාරීන් අභිප්‍රේරණය කිරීම අරමුණු කොට ගනිමින් එම සියලුම මධ්‍යස්ථාන 2018 වර්ෂයේ සිදුකරන ලද සේවාවන් පිළිබඳ වාර්තා අධ්‍යයනය කොට එම මධ්‍යස්ථාන ඇගයීම් සිදුකිරීම සඳහා වැඩසටහනක් මහජන සම්බන්ධතා අංශය මගින් ක්‍රියාත්මක කෙරිණි. ඒ අනුව ගාල්ල, නුවරඑළිය,

අනුරාධපුරය හා කුරුණෑගල යන දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානවලින් වාර්තා ඉදිරිපත් වූ අතර එම වාර්තා විශ්ලේෂණය කර කුරුණෑගල මධ්‍යස්ථානය ඇගයීමට 2018 වර්ෂයේදී කටයුතු කරන ලදී.

9.3.5 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව සංවර්ධන මානයන් පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම හා පවත්නා රැකියා අවස්ථාවන් පිළිබඳව මහජනතාව, පාසල් සිසුන්, පාසල් හැරගිය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව සිසුන් දැනුවත් කිරීම වවුනියාව, අනුරාධපුරය, මඩකලපුව, අම්පාර, මොනරාගල, බදුල්ල, නුවරඑළිය, කුරුණෑගල, පොළොන්නරුව, ගම්පහ සහ රත්නපුර යන ස්ථානයන්හි සිදුකල අතර එම වැඩමුළු සඳහා සිසුන් 2200 කට ආසන්න ප්‍රමාණයක් සහභාගි විය.

බොහෝ සිසුන් පිරිසක් මෙවන් ආයතන පිළිබඳව වඩා පුළුල් අවබෝධයක් ලද අතර වැඩිදුර දැනුවත් කිරීම් සඳහා එම දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානවලට වගකීම පැවරිණ.

9.3.6 සේවාලාභීන්ගේ දැනුවත් වීම උදෙසා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් කෙරෙන කාර්යයන් පිළිබඳව තොරතුරු සංග්‍රහයක් සකස් කිරීම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සේවාවන් මහජනතාව අතරට ගෙන යාම හා නිවැරදි තොරතුරු ලබාදීම යන කරුණු පෙරදැරි කරගනිමින් තොරතුරු සංග්‍රහයක් මුද්‍රණය කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව සෑම අංශයකම සියලු තොරතුරු ඇතුලත් වන පරිදි තොරතුරු සංග්‍රහය සකස් කිරීම 2018 වර්ෂය තුළදී ඉටු කිරීමට කටයුතු කර ඇත.

9.3.7 අමාත්‍යාංශ යටතේ පවත්නා පුහුණු ආයතන හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිබඳව මහජනතාව, පාසල් සිසුන්, දෙමාපියන් දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා සකස් කිරීම.

විවිධ ප්‍රදේශයන්හි කාර්මික අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයන්ට අදාලව පවත්වනු ලබන ප්‍රදර්ශනවලදී බෙදාහැරීම සඳහා හා පුහුණු ආයතනවලට බෙදාහැරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ තොරතුරු ඇතුළත් අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම 2018 වර්ෂයේ සිදුවිය.

9.3.8 ජනමාධ්‍ය සමඟ සම්බන්ධව වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රචාරය කිරීම හා තොරතුරු බෙදා හැරීම.

කාර්මික වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව තොරතුරු බෙදාහැරීම හා වෘත්තීය සංවර්ධනයන් පිළිබඳ දැනුවත් කිරීම උදෙසා ජනමාධ්‍ය උපයෝගී කරගනිමින් මහජනතාව දැනුවත් කිරීම මහජන සම්බන්ධතා අංශයෙන් 2018 වර්ෂයේදී සිදුකල අතර වැඩසටහන් රැසක් සඳහා සහභාගී විය. ජාතික ගුවන් විදුලිය මෙන්ම පෞද්ගලික ගුවන් විදුලි වැඩසටහන්, රූපවාහිනී වැඩසටහන් සඳහා මේ යටතේ සම්පත්දායකත්වය ලබාදෙන ලදී.

9.3.9 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින්නාවූ අවස්ථාවන් පිළිබඳව තෝරාගත් කණ්ඩායම් සඳහා විශේෂ වැඩසටහන් පැවැත්වීම.

කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙහි ප්‍රතිලාභ සියලුම පුරවැසියන්ට එකසේ ලැබිය යුතු අතර එහි එක් පියවරක් ලෙස වෘත්තීය ක්ෂේත්‍රයට දායකත්වය ලබා ගැනීම අරමුණු කරගනිමින් කාන්තාවන්ට හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හට වැඩසටහන් පවත්වන ලදී. එහිදී වවුනියාව ඕහාන් ආයතනය හා දොන් බෝස්කෝ ආයතනය, වෙල්ලාවේලි කාන්තා සමිතිය, වවුනියාව වෙරොඩ් ආයතනයෙහි සියලුම සාමාජිකයන් සහභාගී කරගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය. එමෙන්ම ජාතික මානව සම්පත් සංවර්ධන සභාව මඟින් පළාත්, දිස්ත්‍රික්ක මට්ටමින් සංවිධානය කරන ලද තරුණ, තරුණියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා රැකියාගත කිරීමේ වැඩසටහන් 04ක් සඳහා සම්පත්දායකත්වය සපයන ලදී.

9.3.11 ආංශික නිපුණතා සභාවලින් ආවරණය නොවන ක්ෂේත්‍රයන් සඳහා පළාත් මට්ටමින් වැඩසටහන් පැවැත්වීම.

එක් එක් දිස්ත්‍රික්කයන්වල කර්මාන්තකරුවන්, පුහුණු ආයතන, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනයට සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන්ද එමෙන්ම වාණිජ හා කර්මාන්ත මණ්ඩලය ඒකාබද්ධව රැකියාවලට අනුකූලව පුහුණු අවශ්‍යතා හඳුනාගනිමින් ඒවා වැඩිදියුණු කිරීම, කර්මාන්තයට අවශ්‍ය මෘදු කුසලතා වර්ධනය මෙන්ම විවිධ ගැටළු නිරාකරණය කරමින් කර්මාන්ත ගත පුහුණුව වඩා ශක්තිමත් කර පුහුණු ආයතන හා කර්මාන්තකරුවන් අතර වඩාත් හොඳ සම්බන්ධතාවයක් ගොඩනැගීම මෙහි පරමාර්ථය විය. ඒ අනුව දිස්තික්ක 11 ක් ආවරණය වන පරිදි මෙම වැඩසටහන් ක්‍රියාත්මක කල අතර එහි රැස්වීම ත්‍රෛමාසිකව පැවැත්වීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත භාර කෙරිණි. වව්නියාව, අනුරාධපුරය, මඩකලපුව, අම්පාර, මොනරාගල, බදුල්ල, නුවරඑළිය, ත්‍රිකුණාමලය, පොලොන්නරුව, කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්ගේ මෙම ප්‍රාදේශීය කර්මාන්ත සංසද පැවැත්විය.

9.3.12 ආංශික නිපුණතා සභාව, වාණිජ හා කර්මාන්ත මණ්ඩලය මෙන්ම දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ඒකාබද්ධව ප්‍රචාරණ වැඩසටහනක් පැවැත්වීම.

වාණිජ හා කර්මාන්ත මණ්ඩලය, දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ඒකාබද්ධව තරුණ තරුණියන්, වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුලාභීන් සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් මාලාවක් මහජන සම්බන්ධතා අංශයේ මෙහෙය වීමෙන් සිදුකෙරිණි.

එහිදී වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රූපලාවන්‍ය හා කේෂාලංකරණ ශිල්පීන්ගේ වැඩමුළුවක් මෙන්ම ත්‍රිකණාමලය, අම්පාර, කළුතර, ගාල්ල, රත්නපුර හා මාතර වැඩමුළු 7ක් වන පරිදි වැඩසටහන් මාලාවක් ජූලි ,අගෝස්තු, සැප්තැම්බර් හා දෙසැම්බර් යන මාසවලදී පැවැත්විය.

9.3.13 ප්‍රතිපත්ති සංවර්ධනය උදෙසා ජාතික වෘත්තීය මාර්ගෝපදේශන නියාමන කමිටුවක් ක්‍රියාත්මක කිරීම.

කාර්මික හා අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සේවාව වඩාත් ශක්තිමත් කරමින් ජාතික වෘත්තීය මාර්ගෝපදේශන නියාමන කමිටුවක් ස්ථාපිත කල අතර ඒ සඳහා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ මාර්ගෝපදේශන කටයුතුවල නියැලෙන ආයතන බොහෝ ගණනාවක නියෝජිතයන් සහභාගී විය. එහිදී වෘත්තීය මාර්ගෝපදේශන සේවාව පොදු සේවාවක් ලෙස ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලද අතර ඒ අනුව වෘත්තීය මාර්ගෝපදේශන සේවාව පිළිබඳ පුළුල්ව අධ්‍යනය සඳහා සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි කමිටු හතක් පත් කරන ලද අතර එහි වාර්තා සංවර්ධනය කිරීමේ වගකීම අදාල කමිටුවලට භාරදෙන ලදී.

9.3.14 පොදු වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන සංවර්ධනය හා වැඩිදියුණු කිරීමට දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානවලට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම.

දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන අලංකාරවත්ව සිත් ඇදගන්නා සුළු ආකාරයට පවත්වාගෙන යාමට අවශ්‍ය මධ්‍යස්ථාන 12 ක් සඳහා මුදල් ප්‍රතිපාදන අදාල ප්‍රධාන කාර්යාලය වෙත ලබා දෙන ලදී. ඒ අනුව දිස්ත්‍රික් මාර්ගෝපදේශන මධ්‍යස්ථාන පිහිටුවා ඇති කාර්මික හා තාක්ෂණ විද්‍යාල අටකටත් (ගාල්ල, රත්නපුර, අනුරාධපුර, මඩකලපුව, කුරුණෑගල, කොළඹ, වව්නියාව, කෑගල්ල) ආධුනිකත්ව හා පුහුණු කිරීමේ ආයතන යටතේ මධ්‍යස්ථාන 3 කටත් (මාතර, බදුල්ල, කොළඹ) සහ වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ තංගල්ල මධ්‍යස්ථානයටත්(හම්බන්තොට දිස්ත්‍රික්කය) ප්‍රතිපාදන ලබා දී සංවර්ධන කටයුතු නිමකර ඇත.

9.3.16 නිපුණතා සංවර්ධන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්, වෘත්තීය මාර්ගෝපදේශන ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා කුසලතා වර්ධන වැඩසටහන් පැවැත්වීම.

කාර්මික වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව ප්‍රජාව අතරට නිවැරදිව ලබා දෙන ප්‍රධානතම නිලධාරී සමූහය වන්නේ වෘත්තීය මාර්ගෝපදේශන හා නිපුණතා සංවර්ධන නිලධාරීන්ය. එම නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම හා නවතම දත්තයන් පිළිබඳව දැනුවත් කිරීම තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මහජන සබඳතා අංශයෙන් ක්‍රියාත්මක කරන ලද විශාල සේවයකි.

එහිදී වවුනියාව, අම්පාර, මඩකලපුව යන දිස්ත්‍රික්කයන්වල සිටින සියලුම නිලධාරීන් උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර එහිදී නිලධාරීන්ගේ කුසලතා වර්ධනය සඳහා වැඩසටහනක අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී. ඒ අනුව වර්ධනය කර ගත යුතු පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම උදෙසා නිලධාරීන් කණ්ඩායමක් සමඟ වැඩසටහනක් TITP ආයතනයේ පවත්වන්නට යෙදුනි. එහිදී හඳුනාගන්නා ලද පුහුණු අවශ්‍යතාවයන්ට යෝග්‍ය සම්පත්දායකත්වයක් ලබා ගනිමින් ශ්‍රී ලංකාව තුළ සියලු වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් හා නිපුණතා සංවර්ධන නිලධාරීන් කණ්ඩායම් 4ක් සඳහා දින 3ක වැඩමළුවක් ලෙස පවත්වන්නට යෙදුනි.

9.3.16 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා වාර්තාමය වැඩසටහනක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබන සේවාවන් පිළිබඳව නිවැරදි අයුරින් හා සිත් ඇදගන්නා සුළු අයුරින් මහජනතාව වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්තාමය වැඩසටහනක් නිර්මාණය කිරීමට අවශ්‍ය ආයතන සමඟ සාකච්ඡා කොට මූලික වැඩකටයුතු 2018 වර්ෂයේදී අවසන් කර ඇත.

මහජන සම්බන්ධතා අංශය විසින් සිදුකරන ලද විශේෂ වැඩසටහන්

- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ආධාර සපයන ව්‍යාපෘති / වැඩසටහන් සමඟ කටයුතු කිරීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සේවාවන් පිළිබඳව සමස්ථ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන ඇතුළු වැඩසටහන් සංවිධානය කිරීම හා සහභාගී වීම.
- කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා සම්පත්දායකත්වය ලබා දීම.
- ජාතික වශයෙන් පවත්වන ක්ෂේත්‍රයට සම්බන්ධ වැඩසටහන් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියෝජනය ලබාදීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතිනතය ලත් පෞද්ගලික පුහුණු ආයතනවල ගැටළු නිරාකරණය කරමින් සබඳතාව මනා ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- 2018 වර්ෂයේ කුරුණෑගල පැවති යොවුන්පුරය වැඩසටහන මහජන සම්බන්ධතා අංශය මඟින් සම්බන්ධීකරණය කොට පවත්වාගෙන යන ලද අතර ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාම තුළින් මහජනතාව වෙත තොරතුරු ලබා දීම.
- 2018 වර්ෂයේ පැවති 2025 දැක්ම, මොණරාගල ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටියක් මඟින් අවශ්‍ය තොරතුරු ලබා දීමත් වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව උනන්දුවක් දක්වන සියලු ජනතාව දැනුවත් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- මංජුල විදානපතිරණ මහතා අධ්‍යක්ෂ (වැ.බ.) සහ සහකාර අධ්‍යක්ෂ කේ. ඒ. ඩී. හෂන්ති ලක්මිණී මහත්මිය ආංශික නිපුණතා සභාවන්හි මාණ්ඩලීය රැස්වීම් සඳහා සහභාගී වීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයෙන් සම්පාදනය කරනු ලබන "වෘත්තීය අධ්‍යාපනයට හා වෘත්තීය පුහුණුවට මඟ" (TVET Guide) සඳහා මහජන සම්බන්ධතා අංශයෙන් ලිපි පළ කිරීම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සඳහා මහජන සම්බන්ධතා අංශයේ නිලධාරීන් සම්බන්ධ වූ අතර ප්‍රාදේශීය කර්මාන්ත සභා හා ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා මෙම කමිටුවලට යෝජනා ඉදිරිපත් කිරීම.
- ආංශික නිපුණතා සභාවන්ගෙන් ආවරණය නොවන අනෙකුත් ක්ෂේත්‍රයන් සඳහා ස්වේච්ඡාවෙන් කටයුතු කළ හැකි ප්‍රවීණයන්ගේ සහය ලබාගැනීමට පුවත් පත් දැන්වීම් පලකොට අයදුම්පත් කැඳවා ඔවුන් සඳහා වැඩමුළුවක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- මෙරටට පැමිණෙන ශ්‍රමිකයන් සඳහා සපුරාගත යුතු සුදුසුකම් සේම නීතිරීති හා රෙගුලාසි පිළිබඳව ප්‍රතිපත්ති ප්‍රකාශයන් සැකසීමට දායක වීම.

- අග්‍රාමාත්‍ය කාර්යාලය මගින් සංවිධානය කරනු ලබන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හට වෘත්තීය පුහුණුව ලබා දීමේ රැස්වීම්වලට හා වැඩසටහන්වලට දායකත්වය ලබාදීම හා අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දීම.
- අමාත්‍යාංශය මගින් විදේශ ශිෂ්‍යත්ව සඳහා නිපුණතා සංවර්ධන නිලධාරීන් තෝරා ගැනීමට පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ සඳහා දායකත්වය ලබා දීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනෙකුත් අංශයන්හි රාජකාරි සඳහා අවශ්‍ය ඉල්ලීම් අනුව සහභාගි වීම හා කටයුතු කිරීම.
- කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සහ අංශයේ කාර්යයන් සඳහා අවශ්‍ය පුවත්පත් දැන්වීම් පලකිරීමට පියවර ගැනීම.
- TVEC facebook යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

10.0 තොරතුරු පද්ධති අංශය

කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශය මගින් විවිධ වූ තොරතුරු එක්රැස් කර අවශ්‍ය පරිදි පිරිසැකසුම් කර එම තොරතුරු අදාල පාර්ශවයන්ට ලබාදීමේ කාර්යය ඉටු කරනු ලැබේ.මෙම කාර්ය සඳහා පරිගණක හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගන්නා අතර,එමගින් තොරතුරු භාවිතයට ගැනීමට වැඩි පහසුවක් හා උපයෝගීතාවයක් ඇති වේ.තොරතුරු සාමුහිකව පරිහරණය කිරීම තුලින් ආයතනික සංවර්ධනය ලඟා කර ගත හැකිය.තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයෙන් මෙම අත්‍යවශ්‍ය තොරතුරු සේවාව විධිමත් පරිදි ලබාදීම සඳහා නවීනතම තාක්ෂණය උපයෝගි කරගනී. එම තොරතුරු ආයතනික දියුණුව සඳහා සාර්ථකව පරිහරණය කිරීමට හැකි වන අයුරු උපාය මාර්ග හා විධිවිධාන සැලසීම මගින් දිනපතා සීඝ්‍රයෙන් වර්ධනය වන තොරතුරු සමුදාය හරහා සිදුවේ.

10.1 තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන අරමුණු

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන් විධිමත් හා පහසු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම,ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම ද සිදුවේ. තොරතුරු පද්ධති අංශය අධ්‍යක්ෂ (වැඩ බලන), ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂක හා සංඛ්‍යාලේඛනඥ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා පුස්තකාලයාධිපති, වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂක, සහකාර අධ්‍යක්ෂකවරු 3ක්, සංවර්ධන නිලධාරියෙකු, සම්බන්ධීකරණ නිළධාරී හා පරිගණක චිත්‍රක ශිල්පී හා පරිගණක දෘඩාංග ශිල්පී ඇතුළු කාර්යය මණ්ඩලයකින් 2018 වසරේදී සමන්විත විය.

තොරතුරු පද්ධති අංශයේ ප්‍රධාන කාර්යයන් සහ වැඩසටහන් පහත දැක්වේ.

- ඉල්ලුම අනුව ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කිරීම.
- ඉදිරි වර්ෂය සඳහා වෘත්තීය අධ්‍යාපනයට හා වෘත්තීය පුහුණුවට මඟ (TVET Guide) ප්‍රකාශයට පත්කිරීම හා අවශ්‍ය තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම.
- UNEVOC ප්‍රාදේශීය මධ්‍යස්ථානය පවත්වගෙනයාම සහ එහි කාර්යයන් සහ වැඩසටහන් දිගටම ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය හා වෙබ් පිටුව සංවර්ධනය කර පවත්වාගෙන යාම.
- ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සංග්‍රහය සැකසීම හා ප්‍රකාශයට පත්කිරීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පුවත් ලිපිය (Newsletter) සැකසීම හා ප්‍රකාශයට පත් කිරීම.
- තෘතීයීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් අංශයන්ගේ කටයුතු සාර්ථකව පවත්වා ගැනීම සඳහා පරිගණක පද්ධති නිර්මාණය කිරීම සහ පවත්වාගෙම යෑම.
- කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති සහ ලියාපදිංචි විය යුතු ආයතන සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යාම සහ එම කටයුතු සාර්ථකව කරගෙන යෑමට අවශ්‍ය තොරතුරු එම ආයතන වෙත ලබා දීම.
- අප ආයතනය යටතේ ක්‍රියාත්මක වන සේවාවන් පිළිබඳව තොරතුරු මහජනතාව සඳහා ලබා දීමට අවශ්‍ය වන TVEC වෙබ් අඩවිය නිර්මාණය කිරීම, පවත්වාගෙන යෑම සහ යාවත්කාලීන කිරීම.
- ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත් මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍ය වන පරිගණක මෘදුකාංග පවත්වාගෙන යෑම, අවශ්‍ය දත්ත ඇතුලත් කිරීම සඳහා අනෙකුත් ලියාපදිංචි පුහුණු ආයතන වෙත උපදෙස් ලබා දීම හා එම දත්ත කළමනාකරණය.

- SSDP වැඩසටහන යටතේ නිර්මාණය වන කලමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) හා සම්බන්ධවී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට අවශ්‍ය තොරතුරු ලබාදීම.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන සෑම අංශයකටම අවශ්‍ය වන පරිගණක යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගැනීමේදී ඇති වන අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය වන පිරිවිතරයන් ලබා දීම. හා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම.
- ආයතනය තුල පරිගණක ජාලගත කිරීම, අන්තර්ජාල සහ විද්‍යුත් තැපෑල පහසුකම් ලබා දීම, මේ සඳහා අවශ්‍ය Servers නිසි ආකාරයෙන් පවත්වාගෙන යෑම හා ඒවයේ දෘඩාංග හා මෘදුකාංග යාවත්කාලීන කිරීම.
- කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලයට පුස්තකාල සේවාව හා ආශ්‍රිත තොරතුරු පහසුකම් සැලසීම හා පුස්තකාලය පවත්වාගෙන යාම.
- අවශ්‍ය වූ විට අදාල පරිදි ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු විශ්ලේෂණය කර සම්පාදනය කිරීම,යනාදී කටයුතු මින් ප්‍රධාන ස්ථානයෙහි ලා ගැනේ.
- කොමිෂන් සභාවේ කටයුතු වලට අවශ්‍ය පරිගණක චිත්‍ර නිර්මාණය කිරීම.

මෙම අංශයේ ප්‍රධාන තොරතුරු පද්ධතිය සමන්විත වන්නේ ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය, ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමේ පද්ධතිය, සැලසුම් සහ පර්යේෂණ පද්ධතිය හා ආයතන ලියාපදිංචි කිරීමේ හා පාඨමාලා ප්‍රතීතනය කිරීමේ තොරතුරු පද්ධතිය යනාදී තොරතුරු පද්ධතීන්ගෙනි. 2017 වර්ෂය තුලදී මෙම අංශය මගින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් හා සේවාවන් ඉටුකිරීමට සමත් වී ඇත.

10.2 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ වර්තමාන රැකියා ඉල්ලුම සහ අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සැපයීම අරමුණු කරගෙන ඊට අදාල ශ්‍රම වෙළෙඳපොල තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර ඇත.

දත්ත සමීක්ෂණය හා විශ්ලේෂණය මගින් ලබාගන්නා ලද ශ්‍රම වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, වෘත්තීය මාර්ගෝපදේශකයන්, රැකියාගත කිරීමේ නියුතු ආයතන ,පුහුණුකරුවන්, සේවායෝජකයන් හා රැකියා අපේක්ෂකයින් යනාදී පාර්ශවවල ප්‍රයෝජනය සඳහා ප්‍රකාශයට පත්කරනු ලැබේ.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ශ්‍රමවෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය (LMI Bulletin) මගින් හා කොමිෂන් සභාවේ අන්තර්ජාල පිටුව (TVEC website:www.tvec.gov.lk) මගින් ලබාගත හැක.

10.3 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය පිළියෙල කිරීම හා ප්‍රකාශ කිරීම.

2018 වසර තුළ දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන 2 ක් ප්‍රකාශයට පත්කිරීමට තොරතුරු පද්ධති අංශයට හැකිවිය. මෙම ප්‍රකාශන මගින් 2015 වසරේ අග භාගයේදී සහ 2017 වර්ෂයේ මුල් භාගය තුල ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළේ පැවැති ස්වභාවය විනිවිදව විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීමට සමත් වී තිබේ.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සංග්‍රහය පහත සඳහන් පරිදි කොටස් 5 කින් යුක්ත වේ.

1. රැකියා සඳහා ඇති ඉල්ලුම
2. සේවානියුක්තිය
3. සේවාවියුක්තිය
4. ශ්‍රම වෙළෙඳපොළ සැපයීම හෙවත් විවිධ රැකියාවලට ඇති ශ්‍රම සැපයුම
5. ශ්‍රම වෙළෙඳපොළ සඳහා ඇති ඉල්ලුම සහ පර්යේෂණ තොරතුරු

2018 වසර තුල දී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා තොරතුරු පද්ධති අංශය ක්‍රියාකර ඇත.

ඒ අනුව, ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයට නව මුහුණුවරක් දෙමින් ශ්‍රම වෙළෙඳපොළ සම්බන්ධව කරන ලද පර්යේෂණ හා ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු, ශ්‍රම වෙළෙඳපොළ ගමන්මග පිලිබඳ විශේෂ උනන්දුවක් දක්වන අයට වඩා ප්‍රයෝජනවත් වන ආකාරයට මෙම ප්‍රකාශනය තුලින් එළි දැක්වීමට කටයුතු කරන ලදී.

ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනයේ දේශීය හා විදේශීය වශයෙන් රැකියාවලට ඇති ඉල්ලුම, දේශීය හා විදේශීය වශයෙන් ඇති පුවත්පත් දැන්වීම් පදනම් කරගෙන එක් එක් කර්මාන්ත අංශයන් හී ඇති රැකියා අවස්ථා, රැකියාගතවීම්, අධ්‍යාපන සුදුසුකම්, ස්ත්‍රී/පුරුෂ භාවය හා පලපුරුද්ද ආදී වශයෙන් රැකියාවට සම්බන්ධ අදාල තොරතුරු අන්තර්ගත කර ඇත.

2006 සිට 2018 වර්ෂය දක්වා එක් එක් වර්ෂයන්හි "ලංකාදීප" හා "Sunday Observer" පුවත්පත් මගින් සමීක්ෂණය කරන ලද දැන්වීම් ගණන අංක 8.1 වගුවේ දැක්වේ.

වගුව 8.1 - සම්පාදනය කරන ලද රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව

වර්ෂය	රැකියා පිළිබඳ දැන්වීම් සංඛ්‍යාව
2006	104,839
2007	113,060
2008	116,157
2009	82,167
2010	124,741
2011	108,193
2012	136,994
2013	107,698
2014	91,430
2015	81,369
2016	74,248
2017	226,555

2017 වර්ෂයේ සිට සිළුමිණ පුවත්පත වෙනුවට ලංකාදීප පුවත්පත යොදාගැනිම.



2006-2017 වර්ෂය දක්වා පැවති රැකියා පිළිබඳ දැන්වීම් පහත ස්ථම්භ ප්‍රස්ථාරය මගින් දැක්වේ.



පුවත්පත් දැන්වීම් මගින් පලකර ඇති රැකියා පුරප්පාඩු මට්ටම තවදුරටත් සාර්ථක කරගැනීමට විද්‍යුත් තැපෑල හා වෙබ් අඩවි තොරතුරු සලකා බලන ලදී.

10.3 ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු වෙබ් පිටුව

කාර්යක්ෂම හා ඵලදායී ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු සේවාවක් යාවත්කාලීනව ලබාදීමට ඒවා භාවිතා කරන්නන් හට ලබාදීමේ අරමුණින්ම වෙන් වූ මෙම වෙබ් අඩවිය 2018 වසර තුල යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත. එම තොරතුරු Interactive Graphs සහ Table ලෙස තවදුරටත් 2018 වසර තුල වැඩි දියුණු කරන ලදී. එමගින්,

මදන් ආර්.	110	2014.01.27	4	54,353.00	108,706
ද. සිල්වා ඊ. ඒ. කේ.	112	2014.02.10	4	57,710.00	115,420
සමරවික්‍රම සී. සී. කේ.	116	2014.08.01	4	33,713.00	67,426
හදපාන්ගොඩ බී. සී.	117	2014.09.15	4	52,143.00	104,286
කුමාර එච්. එල්. කේ. එස්.	118	2014.09.22	4	29,498.00	58,996
කාරියවසම් පී. ඩී. එස්.	119	2014.10.01	4	61,067.00	122,134
ඒ. එච්. එන්. සදමාලි	122	2015.06.03	3	34,419.00	51,629
එච්. ඒ. ඩී. දර්ශිකා	123	2015.06.04	3	34,419.00	51,629
එල්. කේ. කොහොම්බන්	125	2015.06.06	3	33,360.00	50,040
එන්. එච්. එස්. දර්ශන	126	2015.06.07	3	33,360.00	50,040
එස්. බී. කරුණානායක	128	2015.06.08	3	33,360.00	50,040
බී. එල්. කේ .පී. සංදීපනි	129	2015.06.09	3	30,640.00	45,960
අයි. එම්. පී. එච්. ලක්මාල්	131	2015.07.08	3	28,016.00	42,024
එච්. එම්. වී. එන්. හේරත්	132	2015.07.22	3	32,068.00	48,102
පී. ඩබ්. එස්. භාෂිනි	136	2016.09.01	2	52,143.00	52,143
එන්. රාජපක්ස	137	2016.09.01	2	49,961.00	49,961
පහළට ගෙන යන ශේෂය					**164,59,716**

නම	සේවක අංකය	පත්වීමේ දිනය	වසර ගණන	වැටුප (රු)	පාරිතෝෂික ප්‍රතිපාදන (රු)
ඉදිරියට ගෙන ආ ශේෂය					**16459716**
ඩබ්. ජී. එස්. කුමාර	138	2016.10.03	2	52,143.00	52,143
ඊ. සී. යූ. ගුණතුංග	139	2016.09.01	2	52,143.00	52,143
ඩබ්. එම්. ඩබ්. බී. විජේසිංහ	140	2016.09.01	2	52,143.00	52,143
කේ. එම්. ඩී. එච්. ලක්මිණි	141	2016.09.01	2	52,143.00	52,143
ජයමිණී මධුෂා	145	2017.05.22	1	27,620.00	13,810
එච්. ජී. නිපුන හංසක	146	2017.05.22	1	30,164.00	15,082
ඊ. ඩබ්ලිව්. විජයංග	148	2017.05.22	1	30,164.00	15,082
ඩී. ඩබ්. ඉෂානි	149	2017.05.22	1	30,164.00	15,082
රවිඳු රන්දික කුමාර	151	2017.08.25	1	27,620.00	13,810
වී. එන්. රම්මාවඩු	152	2017.08.25	1	32,068.00	16,034
					164,59,716

*** වැටුප = දෙසැම්බර් මස මූලික වැටුප + ජීවන වියදම් දීමනාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විටිවයි/ඊ/ටීවීඊසී/1/18/21 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 සැප්තැම්බර් 30 දින

අධ්‍යක්ෂ ජනරාල්

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා යථෝක්ත වාර්තාව මේ සමඟ එවමි.

ආර්.එම්.ජේ.රත්නායක
වැඩබලන විගණකාධිපති

පිටපත :- 1. ලේකම් : කර්මාන්ත හා වාණිජ කටයුතු දිගු කාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය.

2. ලේකම් : මුදල් අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. | වීවිවයි/ඊ/වීවිඊසි/1/18/21 | ඔබේ අංකය உமது இல. Your No. |

දිනය திகதி Date | 2019 සැප්තැම්බර් 30 දින

අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකල යුතු වුවත්, 2018 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් හර ශේෂ 39 ක එකතුව වූ රු. 4,102,112 කින් අත්තිකාරම් බැර ශේෂ 23 ක එකතුව වූ රු. 1,024,520 ක් හිලව් කර මූල්‍ය ප්‍රකාශන වල ජංගම වත්කම් යටතේ අත්තිකාරම් ලෙස රු.3,077,593 ක් දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 30 (ආ) හා (ඇ) ඡේද පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී මුදල් නොවන අයිතමයන් යටතේ දැක්විය යුතු සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික වෙන් කිරීම් රු. 4,042,534 කින් මුදල් ගලායාමක් ලෙස දැක්විය යුතු වර්ෂය තුල මුදලින් ගෙවන ලද පාරිතෝෂික ගෙවීම් රු. 995,698 ක් හිලව්කර මූල්‍ය නොවන අයිතම යටතේ පාරිතෝෂික වෙන්කිරීම් ලෙස රු. 3,046,836 ක් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වර්ෂයට අදාල රු. 8,958,303 ක් වූ විලම්භිත ආදායම මූල්‍ය නොවන අයිතම යටතේ රු.5,271,703 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී, සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් ලැබුණු රු. 1,943,990 ක් හා නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියෙන් ලැබුණු රු. 1,578,074 ක් මුදල් ගලා ඒමක් ලෙස දක්වා නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ වල සාධාරණ වටිනාකම් වෙනස්වීම් මත ප්‍රත්‍යාගණනයක් සිදු කල යුතු අතර සාධාරණ වටිනාකම් සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් ඇතිවිට සෑම වර්ෂ තුනකටම හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනයක් සිදුකල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු ශුද්ධ අගය රු. 29,296,226 ක් වූ වත්කම් සම්බන්ධයෙන් 2008 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.100,694,617 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් එම වත්කම් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 61 ඡේදය ප්‍රකාරව පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කිරීමේදී ආයුගණක තක්සේරු ශිල්පක්‍රම භාවිතා කරමින් විශ්වාසදායී ඇස්තමේන්තුවක් සිදු කල යුතු වුවත්, කොමිෂන් සභාව විසින්, නිලධාරියා අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන රු. 16,754,188 ක පාරිතෝෂික වෙන් කිරීම් සිදුකර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂවලට අදාලව ගෙවන ලද එකතුව රු. 1,959,974 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) 2017 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු රු. 940,628 ක මුදල ඉකුත් වර්ෂයේ උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබිය දී සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා ගෙවන ලද මුදල, උපචිත වියදම් ගිණුමට ගලපා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ මාස තුනකට අදාලව බැංකු ගිණුමක් හරහා ගෙවීම් කර තිබුණු රු.1,683,048 ක සේවක අර්ථසාධක අරමුදල්, හඳුනානොගත් ගෙවීම් ලෙස බැංකු සැසඳුමෙහි දක්වා තිබීම හේතුවෙන් මුදල් ශේෂය හා ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසාන තොගය ලෙස හඳුනාගත යුතු රු. 3,456,740 ක් වටිනා පොත් හා සහතික පත්‍ර, වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වර්ෂයට අදාල අතිරික්තය හා අවසන් තොගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 1,696,187 ක් වූ වියදම් ඉකුත් වර්ෂයට අදාල වියදම් ලෙස සලකා ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අත්තිකාරම් ශේෂය තුල ඇතුලත් එකතුව රු.1,879,170 ක් වූ කාර්ය මණ්ඩල අත්තිකාරම් ශේෂය පිළිබඳ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ආපදා ණය ශේෂය රු.7,357,304 ක් වුවද විස්තරාත්මක උපලේඛනය අනුව එම ශේෂය රු. 6,977,460 ක් වූයෙන් රු.379,844 ක වෙනසක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සමාජිකයෙකුට කොමිෂන් සභාවට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යකාරයකින් සමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් නොමැති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(I). මුදල් රෙගුලාසි 135	මුදල් පාලනය සම්බන්ධව බලතල පවරාදීම සිදුකර නොතිබූ නිළධාරියකු විසින් එකතුව රු. 8,903,532 ක්වූ වියදම් වලට අදාළව ගෙවීම් වවුවර් 200 ක් සහතික කර තිබුණි.
(II). මුදල් රෙගුලාසි 257	මුදල් රෙගුලාසි විධිවිධානයන්ට පටහැනිව එකතුව රු. 19,182,032 ක් වූ වියදම් වලට අදාළ වවුවර් 403 ක් වෙනුවෙන් වූ ගෙවීම්, සහතික කිරීමකින් තොරව සිදුකර තිබුණි.
(III). මුදල් රෙගුලාසි 371 (2) (ආ) ඡේදය හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	(i) තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම මාණ්ඩලික නිළධාරියෙකු වෙත පමණක් සිදු කල යුතු වුවත් කොමිෂන් සභාව ඊට පටහැනි ලෙස අවස්ථා 85 කදී කළමනාකරණ සහකාර නිළධාරීන් 15 දෙනෙකු වෙත එකතුව රු. 3,327,069 ක තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික නිළධාරියෙකු වෙත පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කල හැකි වුවත් ඊට පටහැනිව කොමිෂන් සභාව විසින් අවස්ථා 20 කදී රු.115,000 සිට රු.378,000 ක් දක්වා පරාසයක් තුල තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(iii) තත්කාර්යය අතුරු අග්‍රිම ලෙස ලබාගන්නා මුදල් අදාල කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවත් කොමිෂන් සභාවේ තත්කාර්යය අතුරු අග්‍රිම පියවීමේදී මාස 01 සිට මාස 03 දක්වා ප්‍රමාදයන් සිදු වී තිබුණි.

(IV). මුදල් රෙගුලාසි 371(2)(ඇ) ඡේදය

අතුරු අග්‍රිම ලබා දීම පිළිබඳ වූ කිසියම් වැඩපිළිවෙලක් වේ නම් එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කල යුතු වුවත් නිපුණතා ආංශික සභාව වෙත අග්‍රිම ලබාදීම සම්බන්ධයෙන් එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(V). මුදල් රෙගුලාසි 371 (5) හා 373 ඡේද	අග්‍රිම පියවීම එම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකල යුතු වුවත් 2017 හා 2018 වර්ෂයන් තුලදී ලබාදී තිබූ අග්‍රිමයන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.7,877,446 ක් පියවීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.
(VI). මුදල් රෙගුලාසි 372 ඡේදය	අතුරු අග්‍රිම පරීක්ෂා කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, ප්‍රාදේශීය ප්‍රධානියා හෝ ඒ සඳහා බලය දෙනු ලැබූ අන්‍ය නිළධාරියෙකු විසින් මාසයකට එක් වරකට නොඅඩු වන සේ අග්‍රිම පරීක්ෂා කල යුතු වුවත් නිපුණතා ආංශික සභාව වෙත ලබාදී තිබූ අත්තිකාරම් සම්බන්ධයෙන් එවැනි අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.
(VII). මුදල් රෙගුලාසි 395 (ආ) හා (ඇ) ඡේද	කොමිෂන් සභාවේ පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමකට අදාලව 2018 ජනවාරි සිට 2019 ජූලි දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කර නොතිබුණි.
(ආ) 2003 ජුනි 02 දිනැති අංක පිරිඩි/12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 9.3.1 (vii) ඡේදය	විශේෂිත අවස්ථාවකදී වැඩ බැලීමේ පත්වීම් සිදු කළද එය මාස 03 ක් ඉක්මවා ලබා නොදිය යුතු වුවත් ඊට පටහැනි ලෙස මාස 05 සිට මාස 28 දක්වා කාලයක් තුල ඉහල කළමණාකරණයට අයත් තනතුරු 07 ක් සඳහා වැඩ බැලීමේ පත්වීම් ලබාදී තිබුණි.

(ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2.1 ඡේදය	ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඈ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.1.6 වගන්තිය	චක්‍රලේඛය ප්‍රකාරව සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කල යුතු වුවත් 2018 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2019 අගෝස්තු 09 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල , කර්තව්‍ය සහ කාර්යයන්	නිරීක්ෂණ
(අ) 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 2 වගන්තිය අනුව ආර්ථිකයේ මිනිස් සම්පත අවශ්‍යතාවලට සරිලන අයුරින් සියලුම මට්ටම්වල තෘතියික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම කොමිෂන් සභාවේ පොදු පරමාර්ථයක් විය.	කොමිෂන් සභාව විසින් පුහුණු සැලසුම් (VET Plan) සකස් කර අදාල වෘත්තීය පුහුණු ආයතන වෙත ලබාදී තිබුණද ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර නොතිබුණි.
(ආ)1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 15 (1) හා 16 (1) වගන්ති අනුව කිසිදු තැනැත්තෙකු හෝ ආයතනයක් විසින් තෘතියික අධ්‍යාපන පාඨමාලාවන් හෝ වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන් මෙම පනත යටතේ ලියාපදිංචි කරනු නොලැබ නොපැවැත්විය යුතුය.	කොමිෂන් සභාවේ ලියාපදිංචි නොකර රට තුල ක්‍රියාත්මක කරනු ලබන තෘතියික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ආයතන හඳුනාගැනීමට හා එම තොරතුරු යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කොමිෂන් සභාව විසින් කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

  රේඛීය අමාත්‍යාංශයට අයිති ගොඩනැගිල්ලේ 8 වන මහල නවීකරණය කිරීමේ පළමු අදියරට අදාල කොන්ත්‍රාත්තුවේ ලංසු ලේඛනයේ 49.1 ප්‍රකාරව 2017 මැයි 23 දින වන විට දින 142 ක් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.466,856 ක් අයකර ගත යුතු වුවත් දින 44 ක් සඳහා පමණක් ප්‍රමාද ගාස්තු ලෙස රු.144,658 ක් අයකර ගැනීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු රු.322,194 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි.

03. **අනෙකුත් විගණන නිරීක්ෂණ**

(අ) 2008 වර්ෂයේදී රු.2,150,000 කට මිලදී ගෙන තිබුණු මරුටි වර්ගයේ මෝටර් කාර් රථය 2017 සැප්තැම්බර් 18 දින සිට ධාවන කටයුතු වලින් ඉවත් කර නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2015 වර්ෂයේ දී ලෝක කම්කරු සංවිධානය විසින් ලබාදී තිබූ රු.3,103,402 ක මුදල අදාල කාර්යය වෙනුවෙන් වැය කර නොතිබූ අතර වසර 03 කට අධික කාලයක සිට ගෙවිය යුතු ශේෂ වශයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. අදාල ව්‍යාපෘතිය වෙනුවෙන් වැය නොකර ඉතිරි වූ මුදල් පාලක මණ්ඩලයේ හෝ භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආයෝජනය කර තිබුණි.

(ඇ) වෘත්තීය පුහුණුව හදාරන ආධුනිකයන්ට ලබාදීම සඳහා භාණ්ඩාගාර අරමුදල් යටතේ පෞද්ගලික ආයතනයක් වෙතින් මුද්‍රණය කර පුස්තකාලය වෙත 2016 වර්ෂයේදී ලැබී තිබූ වටිනාකම රු. 1,300,645 ක් වූ වර්ග 15 කට අයත් පොත් 7,354 ක් නිකුත් කිරීමකින් තොරව පුස්තකාලයේ රඳවාගෙන තිබුණි.

(ඈ) 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අලෙවිකිරීම සඳහා පුස්තකාලය වෙත ලැබී තිබුණු වර්ග 13කට අදාල වටිනාකම රු.2,119,675 ක්වූ පොත් 6769 ක් සභාපති හා සභාපතිවරයාගේ වාචික උපදෙස් මත නිකුත් කරන බව තොග පොතෙහි සටහන් කරමින් බාහිර පුද්ගලයන් වෙත නොමිලේ නිකුත් කර තිබුණි.

(ඉ) මූල්‍ය අංශයේ ගිණුම් කටයුතු සඳහා භාවිතා කල නිබස් පරිගනකගත ගිණුම්කරණ පැකේජය 2017 මැයි 09 දින සිට ක්‍රියාවිරහිත වීම හේතුවෙන් පද්ධතියට ඇතුලත් කර තිබූ සියළු දත්ත විනාශ වී තිබුණි. තවද පරිගනකයෙන් පිටත දත්ත ගබඩා කර තබා ගැනීමේ පිළිගත්

ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කර නොතිබූ බැවින් දත්ත නැවත ලබා ගැනීමටද නොහැකි වී තිබුණි. 2019 පෙබරවාරි 08 දිනැති අංක VTY/E/TVEC/1/17/19 දරන අවසාන විගණකාධිපති වාර්තාව මගින්ද කරුණු අනාවරණය කර තිබූ නමුත් මේ සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් 2019 ජූලි 31 දින දක්වා ම සිදුකර නොතිබුණි.

(ඊ) කොමිෂන් සභාව විසින් රේඛීය අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් හා සවිකිරීම් සිදුකිරීම සඳහා 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එකතුව රු.11,057,124 ක් වැයකර තිබුණ ද ඒ සඳහා ලිඛිත ගිවිසුමකට එළඹීම හා ශක්‍යතා අධ්‍යනයක් කිරීම සිදුකර නොතිබුණි. ඉදිකිරීම් අවසන් කර 2018 දෙසැම්බර් 31 දින ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් ලබා ගත් තත්ත්ව වාර්තාව අනුව එම පරිශ්‍රය රාජකාරී කටයුතු සඳහා භාවිතා කල නොහැකි තත්ත්වයේ පවතින බව සඳහන් කර තිබූ බැවින් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

ආර්.එම්.ජේ. රත්නායක
වැඩබලන විගණකාධිපති

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල,

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ඔබගේ අංක VTY/E/TVEC/1/18/21 හා 2019/09/30 දිනැති උක්ත විගණන වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

1. මූල්‍ය ප්‍රකාශන

1.2 මතය සඳහා පදනම

(අ) මෙහිදී පාරිතෝෂික අගය ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත්තේ පෙර වර්ෂයේ අවසාන ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂය අතර වෙනසයි. මුදලින් ගෙවූ අගය සහ අදාළ වර්ෂයේ වෙන්කිරීම වෙන් වෙන් ව වාර්ෂික වාර්තාවේ හෙලිදරව් කිරීමට කටයුතු කර ඇත.

(ආ) මෙහිදී පාරිතෝෂික අගය ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත්තේ පෙර වර්ෂයේ අවසාන ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂය අතර වෙනසයි. මුදලින් ගෙවූ අගය සහ අදාළ වර්ෂයේ වෙන්කිරීම වෙන් වෙන් ව වාර්ෂික වාර්තාවේ හෙලිදරව් කිරීමට කටයුතු කර ඇත.

(ඇ) මෙහිදී මුදල් ප්‍රවාහ ප්‍රකාශයට විලම්භිත ආදායමේ අගය ලෙස පෙන්වා ඇත්තේ පෙර වර්ෂයේ අවසාන ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂය අතර වෙනසයි. එයද වාර්ෂික වාර්තාවේ වෙන් වෙන්ව දැක්වීමට පියවර ගෙන ඇත.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාරයේ ප්‍රදානයන් යොදා ගනිමින් මිලදී ගන්නා ලද රු.1,943,990.00 ක් වූ වත්කම් වල අගය සහ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා කරමින් මිලදී ගන්නා ලද රු.1,578,074.00 ක් වූ වත්කම් වල අගය මුදල් යෙදවීමක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ඇතිවූ ප්‍රවාහයන් යන ශීර්ෂය යටතේ දක්වා ඇත.

(ඉ) දේපළ හා පිරියත ප්‍රත්‍යාගණනයක් කිරීමට පියවර ගෙන ඇත.

(ඊ) ක්ෂය කිරීම හීන වන ශේෂ පදනම මත ගණනය කරන බැවින් වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වී නොමැති බව සඳහන් කරමි. ප්‍රමිතියේ 07හි 65 වන ඡේදයට අනුව වත්කම් වල ඵලදායී ජීව කාලය පිළිබඳ සමාලෝචනයක් කර ප්‍රතිශෝධනයක් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත.

(උ) පාරිතෝෂික වෙන් කිරීම මෙතෙක් ගණනය කර ඇත්තේ සේවකයෙක් වර්ෂයේ අවසාන මාසයට උපයාගෙන ඇති වැටුපෙන් අඩක් ගෙන එය සේවා කාලයෙන් වැඩිකිරීමෙනි. ඒ අනුව විගණනයෙන් සඳහන් කළ ඇති පරිදි ආයුගණන තක්සේරු ක්‍රමය භාවිතා කරමින් පාරිතෝෂික වෙන්කිරීම ගණනය කිරීමට උපදෙස් දී ඇත.

(ඌ) සමාලෝචිත වර්ෂයේ වියදම ලෙස ගිණුම්ගතව තිබූ පෙර වර්ෂවලට අදාළ වියදම් පෙර වර්ෂ ගැලපුම් ගිණුම මඟින් ගිණුම්ගත කිරීමට පියවර ගෙන ඇත.

(එ) 2017 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල අර්ථසාධක අරමුදල වන රු.820,530.00 ක මුදල පෙර වර්ෂ ගිණුම තුලින් ගලපා 2018 අදාල අර්ථසාධක අරමුදල් අගය වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමේදී නිවැරදි කරන ලෙස උපදෙස් දී ඇත.

(ඒ) සේවක අර්ථ සාධක අරමුදලට සෘජු බැර කිරීම් කර තිබූ රු.1,683,048 ක් වූ 2018 වර්ෂයේ ජුනි, ඔක්තෝම්බර් සහ දෙසැම්බර් මාස තුනට අදාලව ද්විත්ව සටහන් යෙදීමට පියවර ගනිමි. වාර්ෂික වාර්තාවේ එය හෙලිදරව් කරන ලෙස උපදෙස් දී ඇත.

(ඔ) 2018.12.31 දිනට ශිෂ්‍ය වාර්ථා පොත් නොතිබුණු අතර ඉතිරිව තිබූ ලිපි ද්‍රව්‍ය හා සහතිකපත් වල පිරිවැය පමණක් අවසන් තොගය ලෙස ගිණුම් ගත කරන ලදී. මේ අනුව විගණනයෙන් පෙන්වා දි ඇති පරිදි වෙනත් මුද්‍රිත පොත් වල අගය ගණනයකොට එහි අගය වාර්ෂික වාර්තාවේ හෙලිදරව් කරන ලෙස උපදෙස් දී ඇත.

(ඕ) විගණනයෙන් සඳහන් කර ඇති පරිදි එකතුව රු.1,696,187 ක් වූ පෙර වර්ෂයට අදාළ වියදම් ලෙස ගිණුම්ගත වී තිබූ අගය පරීක්ෂාකර බලා නිවැරදි කරන ලෙස උපදෙස් දී ඇත.

(ක) අත්තිකාරම් ශේෂය තුල පවත්නා රු. 1,879,170.00 ක් වූ ශේෂය පිළිබඳ විස්තරාත්මක ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී ඇත.

(ග) ආපදා ණය ලේඛනය සම්පූර්ණයෙන් පරීක්ෂාකරබලා මෙම වෙනස පිළිබඳව තවදුරටත් අධ්‍යනය කොට එය වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර නිවැරදි කරන ලෙස උපදෙස් දී ඇත.

2. (අ)

i. වසර 03ක ඇගයුම්කරුවන්ගේ ගෙවීම් ප්‍රමාද වී තිබූ බැවින් ඒවා නිරවුල් කිරීමේ කාර්යය කඩිනමින් ඉටු කිරීමේ අවශ්‍යතාවය මත ගිණුම් අංශයෙහි සහකාර අධ්‍යක්ෂවරිය විසින් වවුචර්පත් සහතික කිරීම කර තිබුණි. එම සහතික කිරීම සඳහා ක්‍රමානුකූල බලය පැවරීමේ කාර්යය 2019 වසරෙහි මූල්‍ය බලතල බෙදා හැරීමේදී ඉටුකර ඇත.

ii. මෙහිදී වියදම් සහතික කිරීම පරිගණකගත කරන ලද ගිණුම්කරණ පැකේජය මඟින් සිදු කරන බැවින් අත්සන යෙදීම මඟහැරී තිබුණද අදාළ නිළධාරියා විසින් ගිණුම්කරණ පැකේජය තුළින් වියදම අනුමත කළ පසුව පමණක් ගෙවීමට අදාළ ඉදිරිකටයුතු කළ හැකි පරිදි මූල්‍ය පාලනයක් එම පද්ධතියේ ගොඩනඟා ඇත.

iii. i. කාර්යයන්හි අවශ්‍යතාවයන් මත කළමනාකරණ සහකාරවරුන්ට අත්තිකාරම් නිකුත් කර තිබුණද විගණනයෙන් පෙන්වා දුන් පරිදි මාණ්ඩලික නිළධාරීන්හට පමණක් අත්තිකාරම් ලබා දීමට පියවර ගෙන ඇත.

ii. විගණනයෙන් ලද උපදෙස් අනුව හා 2015 සංශෝධිත මුදල් රෙගුලාසි වලට අනුව එක් අවස්ථාවකදී මාණ්ඩලික නිළධාරියෙකුට රු. 100,000.00 දක්වා පමණක් අත්තිකාරම් නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

iii. අත්තිකාරම් නිකුත් කල කාර්යය නිමවූ විගස අදාල අත්තිකාරම් පියවීමට අදාළ උපදෙස් ලබා දී එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර ඇත.

iv. ආංශික සභා වෙත අග්‍රිම ලබා දීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මණ්ඩලීය රැස්වීමට වාර්ෂික ඇස්තමේන්තු ඉදිරිපත් කර ලබා ගන්නා අතර එම ඇස්තමේන්තු අනුමත වීමෙන් අනතුරුව ආංශික සභා තෙමාසිකව අත්තිකාරම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබයි. එම අත්තිකාරම් ආංශික සභා වෙත නිකුත් කරනු ලබන්නේ මණ්ඩලීය රැස්වීමෙහි අනුමත වූ ඇස්තමේන්තුගත මුදලට අනුකූල වන පරිදිය.

v. නිපුණතා ආංශික සහා සීමාසහිත පෞද්ගලික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් එහි මුදල් වර්ෂය ලෙස සලකනුයේ එක් එක් අවුරුදුවල මාර්තු 31 වන දිනය. එහෙයින් දෙසැම්බර් මාසය තුළදීද ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල මුදල් පියවීම ඊළඟ අවුරුද්ද තුළ ජනවාරි හෝ පෙබරවාරි මාසය තුළ සිදුකරනු ලබයි. රජයේ මුදල් අනුමත කර ගෙවීම් සිදුකිරීමට පෙබරවාරි මාර්තු දක්වා කාලයක් වැය වන බැවින් නිළධාරීන්ට අවශ්‍ය වැටුප් ගෙවීමට පවා ආංශික නිපුණතා සහා වල මුදලක් නොමැති වීම වැනි ප්‍රායෝගික ගැටළු හේතුවෙන් මෙම මුදල් පියවීම ප්‍රමාද වේ.

ඒ කෙසේ වෙතත් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් මේ පිළිබඳව අදාල නිපුණතා ආංශික සභාව වෙත දැනුවත් කර ඇති අතර 2018 වර්ෂයේ සිට දෙසැම්බර් 31 දිනට අදාල සියළු මූල්‍ය කටයුතු ඉටු කරන ලෙස උපදෙස් දී ඇත.

vi. නිපුණතා ආංශික සහා මඟින් සකස් කර ඉදිරිපත් කරන සැලැස්ම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ලබාගන්නා අනුමැතිය අනුව කාර්තු වශයෙන් අත්තිකාරම් මුදල් නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. මෙකී ලබා දෙන අත්තිකාරම මාසිකව නිරවුල් කිරීමට අදාල ආංශික සහා කටයුතු කරන අතර ත්‍රෛමාසිකව ප්‍රගති වාර්තාවක් 2018 වර්ෂයේදී ඉදිරිපත් කර ඇත. එමෙන්ම මාසිකව පවත්වන ලද ආංශික සහා සභාපතිවරුන්ගේ සාකච්ඡාව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර එහිදී මාසිකව ඉටු කරන ලද කාර්යයන් සහ ඉදිරි කටයුතු ගැන සාකච්ඡා කර අවශ්‍ය මග පෙන්වීම් ඉටු කර ඇත. එමෙන්ම එකී සෑම සභාවකම අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මට්ටමේ නිලධාරියකු නිලබලයෙන් පත් කර ඇති අතර මාසිකව පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාල සමස්ථ කාර්යයන් එහි නිළධාරියාගේ අධීක්ෂණයට ලක් වේ. එමෙන්ම අදාල වාර්තාද ප්‍රගතියද සෑම මාසික රැස්වීමකදීම සාකච්ඡාවට භාජනය කරනු ලැබේ.

vii. 2017 වසර ගිණුම්කරණ පැකේජය අක්‍රියවීමත් සමඟම සියළු මූල්‍යමය දත්ත නැවත නව පැකේජයට ඇතුළත් කිරීමේදී ඇති වූ ප්‍රමාදය මේ සඳහා බලපා ඇති අතර 2019 සැප්තැම්බර් මාසය තුළදී 2018 වසරට අදාළ බැංකු සැසඳුම් කිරීමට කටයුතු කරන අතර 2019 වසරේ බැංකු සැසඳුම් ඉදිරි මාස 02තුළදී නිම කිරීමට පියවර ගනිමි.

(ආ) මාස 03 ඉක්මවා වැඩබැලීමේ පත්වීම ලබාදීම සම්බන්ධව හේතු පැහැදිලි කිරීම.

තනතුර		හේතුව
01	අධ්‍යක්ෂ ජනරාල්	2019.05.28 දිනැති කැබිනට් තීරණ අංක 19/1198/115/025 අනුව අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ පුරප්පාඩුව සම්පූර්ණ කර ඇත.
02	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	මෙම තනතුර සඳහා වැඩබැලීම වෙනුවෙන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.5.4 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ දීමනාව ගෙවීම සිදුකරන ලදී. මෙම තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම 2018.05.18 දිනදී සිදුකරන ලද අතර පාලක මණ්ඩල රැස්වීම පැවැත්වීම ප්‍රමාදවීම හේතු කොට ගෙන පත්වීම ලබාදීම ප්‍රමාද විය. තවද, 2018.08.27 දිනදී ලබාගන්නා ලද පාලක මණ්ඩල අනුමැතිය ප්‍රකාරව 2018.09.14 දින ස්ථිර පත්වීම් ලබාදෙන ලදි.
03	අධ්‍යක්ෂ (පාලන)	2018.05.01 දින අධ්‍යක්ෂ (පාලන) හදිසියේ ඉල්ලා අස්වීම නිසා පුරප්පාඩු විය. ඒ අනුව තාවකාලිකව වැඩ බැලීමේ නිළධාරියෙකු පත් කරන ලදී. අදාළ පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ගය ගෙන ඇත. 1. පුරප්පාඩු වූ සියළු අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවා ගැනීමට 2019.08.21 දින පුවත්පත් දැන්වීම් පළකර ඇත.
04	අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා ඇගයුම් පාලන)	
05	අධ්‍යක්ෂ (කර්මාන්ත සබඳතා)	
06	නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රම වෙළඳපොල විශ්ලේෂක තනතුරෙහි සේවය කල ලක්සරා එදිරිසූරිය මහත්මිය වසර 05කට විදේශගතවීම මත 2016.08.22 දින ඇති වූ පුරප්පාඩුව අනුව සේවා අවශ්‍යතාවය මත 2016.1.13 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ වැඩබැලීම සඳහා පත් කර ඇත.

	තනතුර	හේතුව
07	නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම් හා පර්යේෂණ)	සැලසුම් හා පර්යේෂණ අංශය තෘතීයික හා වෘත්තීය අධ්‍යපන කොමිෂන් සභාව වෙනුවෙන් ඉටුකරන කාර්යය භාර්යට අදාලව නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ තනතුරු පුරප්පාඩුවක් පැවති බැවින් සේවා අවශ්‍යතාවය මත අධ්‍යක්ෂ ජනරාල් විසින් එම වැඩ බැලීමේ තනතුර සඳහා මෙම පත්වීම ලබා දීම සිදුකර ඇති අතර මේ සඳහා කිසිදු මුල්‍ය ප්‍රතිලාබයක් හෝ අතිරේක වැටුපක් මේ සඳහා ගෙවා නොමැත. කෙසේ වෙතත් මේ වන විට මෙම වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර ක්‍රියාත්මක නොවනු ඇත.

(ඇ) තවද, 2018 වර්ෂය තුල පැවති සහ වැඩබලන පත්වීම් ලබා දීම් අතුරින් මාස 03 ඉක්මවා වැඩබලන පත්වීම් ලබා දී ඇත්තේ මෙම තනතුරු 07ට අදාලව පමණක් බව කාරුණිකව දන්වමි.

(ඈ) 2018 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය 2019 සැප්තැම්බර් මස 07 වන දින පවත්වා ලේඛන නිවැරදිව සකස්කර විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී ඇත.

බලතල, කර්තව්‍ය සහ කාර්යයන්

(අ) කොමිෂන් සභාව ආංශික පුහුණු සැලසුම් 18ක් පළාත් පුහුණු සැලසුම් 08කට අදාළව වෘත්තීය පුහුණු සැලසුම් සාදා ඇත. මේ සම්බන්ධයෙන් කරනු ලබන පසු විපරම් කටයුතු සඳහා පහත දේ අදාළ වේ.

i. පාඨමාලා ප්‍රතිපාදනය.

ii. මෙම පුහුණු සැලසුම අනුව යටිතල පහසුකම් සඳහා මූල්‍යාධාර පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.

iii. මෙම පසු විපරම් කිරීම මාස 02කට වරක් කොමිෂන් සභාව මූලික කරගෙන පවත්වනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් පාලන කමිටුව (Steering Committee) රැස්වීමේදී සිදු කර ඇත. මෙම රැස්වීම සඳහා අමාත්‍යාංශය නියෝජනය කරන සියළුම වෘත්තීය පුහුණු ආයතන නියෝජිතයන් සහභාගී වී ඇත. ඉදිරියේදී මෙය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා සම්පූර්ණ කරනු ලබන සියළුම වෘත්තීය පුහුණු සැලසුම් සඳහා දියත් කිරීමේ වැඩසටහන් (Launching) ක්‍රියාත්මක කරන අතර එහි පසු විපරම ඉහත සඳහන් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් පාලන කමිටු රැස්වීමේදී ප්‍රගතිය විමසා බලනු ඇත. මෙහි සංක්ෂිප්ත රැස්වීම් සටහන් අවශ්‍ය අවස්ථාවලදී ලබා ගත හැක.

(ආ) ලියාපදිංචි කර ඇති පුහුණු මධ්‍යස්ථානය පිලිබඳව තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් මෙම කොමිෂන් සභාව මගින් පවත්වා ගෙන යනු ලබන අතර එය www.tvec.gov.lk යන වෙබ් අඩවියෙහි වන Information on Registered Training Centers ලෙස මහජනතාවගේ දැන ගැනීම සඳහා තොරතුරු ප්‍රදර්ශනය කර ඇත. එහි මේ දක්වා ලියාපදිංචි කර ඇති ආයතන 2709 ක තොරතුරු ඇතුලත් වේ.

පුහුණු මධ්‍යස්ථානයක ලියාපදිංචිය වසර දෙකකට පමණක් සීමා වන අතර නැවත වසර දෙකකට වරක් අලුත් කළ යුතුව ඇත. එසේ ලියාපදිංචි වී ඇති පුහුණු මධ්‍යස්ථානය ලියාපදිංචිය කල් ඉකුත්වීමට මාස තුනකට (3) පෙර එම මධ්‍යස්ථාන වෙත ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අයදුම් කරන ලෙසට පෙර දැනුම් දීමක් ඊ මේල් මගින් සිදු කරයි. ඒ අනුව ඉල්ලුම් කල පසු නැවත ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රමවේදයට අනුව සිදු කරනු ලබයි.

2018.06.31 දින වන විට ලියාපදිංචිය වලංගුව පැවති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව 807 කි, SSDP 2017 විගණකාධිපති වාර්තාවෙහි සහකාර විගණකාධිපති විසින් ලබා දුන් උපදෙස් අනුව යමින් ඒවා 2018 වසර තුල ක්‍රියාත්මක කිරීමත් සමඟ 2018.06.03 දින පැවති වලංගු ලියාපදිංචි ආයතන සංඛ්‍යාව 807 සිට 2018.12.31 දින වන විට 1096 දක්වා පුහුණු ආයතන වැඩි සංඛාවකට TVEC ලියාපදිංචිය ලබා දීමට හැකිවී තිබේ. ඒ අනුව වලංගු ලියාපදිංචි පුහුණු ආයතන සංඛ්‍යාව 2019.06.30 වන විට 1314 දක්වා තවත් වැඩි වී ඇත. එය 62% ක වර්ධනීය ප්‍රවනතාවයකි. ලියාපදිංචිය කල් ඉකුත් වී ඇති නමුත් නැවත TVEC ලියාපදිංචිය සඳහා අයදුම් නොකල පුහුණු ආයතන සඳහා ලියාපදිංචි කිරීමේ නීතිමය අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කිරීමේ ලිපි මේ වන විට 919 යවා ඇති අතර ඒ අතරින් ආයතන 244 දැනට වසා ඇති බව හඳුනා ගෙන තිබේ. ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමෙන් පසු එය ලබාදීම සඳහා ආයතන වෙත ගොස් ඇගයීමේදී අත්‍යවශ්‍ය නිර්ණායක එම ආයතන විසින් සපුරා නොතිබීම හේතුවෙන් ලියාපදිංචි නොකල ආයතන 470 ක්ද තොරතුරු ද පද්ධති තුල පවතී.

ඒ අනුව කොමිෂන් සභාව තුල ලියාපදිංචිය පිළිබඳව දත්ත පද්ධතියක් තිබෙන බවත් ලියාපදිංචි නොවූ ආයතන ලියාපදිංචි කිරීම සඳහා ක්‍රමවේදයක් අනුගමනය කරන බවත් දන්වා සිටියි.

නමුත් ලියාපදිංචි නිර්ණායක සම්පූර්ණ නොකර පවත්වා ගෙන යනු ලබන ආයතන සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන හා ක්‍රමවේදයක් නොමැති බැවින් TVEC ලියාපදිංචිය නොලබා පවත්වා ගෙන යනු ලබන පුහුණු ආයතන සම්බන්ධයෙන් දැනට කටයුතු කිරීමේ අපහසුතාවයක් කොමිෂන් සභාවට ඇත. මේ සඳහා අදාළ පියවරක් වශයෙන් කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට යෝජනාකර ඇත.

මීට අමතරව මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යය මඟින් වරින් වර මහජනතාව දැනුවත් කිරීම් සිදුකර ඇත.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සම ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර නොමැති බව

මෙම කොන්ත්‍රාත්තුව 2016/11/30 දින ආරම්භකර 2016.12.31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. එනමුත් මෙම ආයතනය වැඩ අවසන් කර අවසාන බිල්පත ඉදිරිපත් කරන ලද්දේ 2016.02.13 දිනය. ඒ අනුව වැඩ අවසන් කිරීම සඳහා ප්‍රමාද කාලය දින 44ක් විය. ඒ සඳහා ප්‍රමාද ගාස්තු 144,658ක් අයකරන ලදී. නමුත් විගණනය විසින් ප්‍රමාද කාලය ලෙස දක්වා ඇති කාලපරිච්ඡේදය ගණනය කර ඇත්තේ අදාළ කොන්ත්‍රාත් ආයතනය විසින් 2017/05/23 දිනැති ඔවුන් වැඩ අවසන් කළ බව සහතික කරන ලද ලිපියේ දිනය පදනම් කරගෙනය. ඒ අනුව මෙම සත්‍ය ලෙස වැඩ අවසන්කළ දිනය වන 2016/02/13 දින සිට 2017/05/23 ලිපිය නිකුත් කරන ලද කාලය මෙම කොන්ත්‍රාත්තුව මඟින් සිදු කරන ලද වැඩ මැනීමට මෙන්ම අනිකුත් තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් පෙන්වා දුන් යම් යම් දෝෂ නිවැරදි කිරීමට ගත වූ කාලය බව සඳහන් කරමි.මේ අනුව සත්‍ය ලෙසම වැඩ අවසන් කර ගෙවීම් සඳහා අවසාන බිල්පත ඉදිරිපත් කළ දිනය ප්‍රමාද කාලය ලෙස ගණනයකර ඇත. එය දින 44ක් බව සටහන් කරමි.

3 අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) KF-7354 අංක දරණ මරුටි වර්ගයේ මෝටර් රථය අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින අතර එයට අවශ්‍ය අමතර කොටස් හිඟතාවය හා මිළ අධික තත්ත්වය මත වාහන අපහරණය කටයුතු සඳහා සූදානම් කර ඇත.

(ආ) මෙම ස්ථාවර තැන්පතු 03 හි අගය 2019.08.21 දින පැවති කොමිෂන් සභාව මඟින් අනුමැතිය ලබා ගෙන සේවක ණය ගිණුමට මාරු කරන ලදී.

(ඇ) 2016 වර්ෂයේදි ලබා දී තිබූ වර්ග 5කට අයත් වටිනාකම රු. 744, 800ක් වූ පොත් 6800 ක් වූ පොත් සියල්ලම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සඳහා ඉංග්‍රීසි භාෂාව හඳුන්වා දීමේදී මුද්‍රණය කල ඉංග්‍රීසි භාෂා පොත් වේ. නමුත් ඉංග්‍රීසි භාෂාව සඳහා NVQ ලබා නොදීමට යම් කාල වලදී ගත් ප්‍රතිපත්තිමය තීරණ නිසා මෙම ඉංග්‍රීසි පොත් වලට ඇති ඉල්ලුම අඩුවිය. එම නිසා මෙම ඉංග්‍රීසි පොත් කොමිෂන් සභා අනුමැතිය යටතේ රජයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා නොමිලයේ ලබා දීමට ක්‍රම වේදයක් ඉදිරියේදි සකස් කරනු ලැබේ.

වටිනාකම රු.554,845ක් වූ වර්ග 10කට අයත් අනෙකුත් පොත් 554 එක් එක් වර්ෂවලට අයත් ශ්‍රමවෙළඳපොල තොරතුරු, වෘත්තීය අධ්‍යාපන පුහුණුවට මඟ (TVET Guide) හා Skill Report ප්‍රකාශන වේ. මේවා අදාල පාර්ශවකරුවන් අතර බෙදා හැර ඇත.වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ නිලධාරින්,පර්යේෂකයින් විවිධ ආධාර ලබා දෙන ආයතන මෙම ප්‍රකාශනය ලබා ගැනීමට පැමිණෙන බැවින් එම අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා සහ පරිශීලනය සඳහා සැලකිය යුතු පිටපත් ප්‍රමාණයක් පුස්තකාලයේ තබා ඇත.

(ඈ) වෘත්තීය වැඩමුළු වලදී පුහුණු ක්ෂේත්‍රයේ ඉංග්‍රීසි ප්‍රවර්ධනය සඳහා පැවැත් වූ වැඩමුළු සඳහා එවකට සිට සභාපතිතුමාගේ වාචික උපදෙස් මත මෙම පොත් නොමිලේ නිකුත් කර ඇත. මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී වළක්වා ගැනීම සඳහා අදාළ සියළුම පියවර ගෙන ඇත.

(ඉ) මේ වන විට අධ්‍යක්ෂ ජනරාල් විසින් ගිණුම්කරණ දත්ත සමුදා විනාශවීම සම්බන්ධයෙන් විමර්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය කමිටුවක් පත් කරමින් මෙහි දක්වා ඇති පරිදි ක්‍රියා කිරීමට මේ වන විට සැලසුම්කර ඇත.

(ඊ) මෙම ගොඩනැගිල්ලේ රාජකාරී කිරීම අවදානම් බව නිළධාරීන් දිගින් දිගටම පැවසීම නිසා 2018 ඔක්තෝම්බර් 31 දිනැති මධ්‍යම ඉංජිනේරු කාර්යය පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් වාර්තාවක් ලබා ගන්නා ලදී.

ඒ අනුව 8වන මහළේ රාජකාරී කිරීමට සුදුසු තත්ත්වයක නොපවතින බවත් එම අටවන මහළ නැවත ප්‍රතිස්ථාපනය කළ යුතු බවත් එම වාර්තාවේ සඳහන්කර ඇත. ඒ අනුව අමාත්‍යාංශයට අයිති මේ ගොඩනැගිල්ලේ අටවන මහළින් අප ඉවත් වූ අතර ඒ වෙනුවට අපහට 06වන මහළින් කාර්යාල පරිශ්‍රයක් ලබාදෙන ලදී.

ඒ අනුව අමාත්‍යාංශ අංක 02-03/03/01/2019 හා 2019/01/08 දිනැති ලිපිය මඟින් අටවන මහළේ කාර්යාල පරිශ්‍රය කොටසක් අමාත්‍යාංශය මඟින් ලබා ගෙන ඇත. එහි එක් කොටසක් අපගේ ලිපි ලේඛණ ගබඩාව ලෙස භාවිතා කරනු ඇත.

ආර්.ඩී.එස්.කුමාරරත්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - ලේකම් - කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු දිගකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමූපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය(දැ.ගැ.ස)

විගණන අධිකාරී - රජයේ විගණන අංශය (දැ.ගැ.ස)

නියෝජ්‍ය අධ්‍යක්ෂ - (අභ්‍යන්තර විගණක හා විමර්ෂණ)- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (දැ.ගැ.ස)

Tertiary and Vocational Education Commission
(Ministry of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation,
Northern Province Development, Vocational Training and Skills Development and Youth Affairs)
'Nipunatha Piyasa', 354/2, Elvitigala Mawatha,
Colombo 05, Sri Lanka
Tel; +94 (0)11 7608000, Fax: +94 (0)11 2555007
email: info@tvec.gov.lk
Web: www.tvec.gov.lk